# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2014

# ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching
Learning
NETS

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2014

## ඇගයීම් වාර්තාව

# 21 - ආර්ථික විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**ආර්ථික විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2014

## මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2014 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 207304 ක් පාසල් අයදුම්කරුවෝ ද 40072 ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) ආර්ථික විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද ආර්ථික විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2014 විභාගයේ ආර්ථික විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයටත් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2016 දෙසැම්බර් 01
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | ලසික සමරකෝන්<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය ඊ. දයාරත්න<br>වාණිජ විද්‍යා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>ගාමිණී වීරසිංහ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>අංශාධිපති<br>ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | ඩබ්ලිව්. ලයනල් වීරසිංහ<br>ගුරු සේවය<br>කො/විශාඛා විද්‍යාලය<br><br>ඩී.ජී. සුගත්<br>ගුරු සේවය<br>මාර/සාන්ත තෝමස් උසස් බාලිකා විද්‍යාලය<br><br>එම්. ජී. තමරා ටී. කාරියවසම්<br>ගුරු සේවය<br>ගා/සංඝමිත්තා බාලිකා විද්‍යාලය<br><br>එස්. එන්. බී. එම්. එස්. රංජනී<br>ගුරු සේවය<br>කළු/මිරිස්වත්ත ජාතික පාසල<br><br>කේ.එන්. නිශාන්ත<br>ගුරු සේවය<br>ර/ඇඹි/ජනාධිපති විද්‍යාලය |
| **පරිගණක පිටපත සැකසුම** | : | ඕ.එම්. දර්ශනී සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය සැකසුම** | : | වයි.එස්. අනුරාධි<br>සංවර්ධන නිලධාරි |

# ඇතුළත පිටු

පිටු අංකය

## I කොටස


1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5
1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6
1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6
1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7


## II කොටස


2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 9
2.1.2. I ප්‍රශ්න පත්‍රය 10
2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 17
2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ 18
2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 19
2.1.6. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 20

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 22
2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23
2.2.3. II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 57


## III කොටස


3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 58
3.2. ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 62

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1. විෂය අභිමතාර්ථ

- ★ සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විචාරාත්මක අවබෝධයක් ලබාදීම.
- ★ ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ සාර්ව ආර්ථික විචල්‍යවල හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම.
- ★ වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශනය කිරීමට පෙළඹවීම.
- ★ ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම.
- ★ විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ ව පිළිගත් අර්ථකථන අධ්‍යයනයට අවස්ථා ලබාදීම.
- ★ වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ ව විමසා බැලීමට යොමු කිරීම.
- ★ පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබාදීම.
- ★ ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබාදීම.
- ★ ආර්ථික විද්‍යා විෂයය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීම.
- ★ අන්තර්ජාතික වෙළෙඳාමේ, මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වා දීම.
- ★ ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම.
- ★ සමාජයේ යහපැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබාදීම.
- ★ උසස් අධ්‍යාපනයට යොමු වීම සඳහා යෝග්‍ය පදනමක් ලබාදීම.

## 1.2. විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1. විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 61351 | 5513 | 66864 |
| දෙමළ | 9671 | 1313 | 10984 |
| ඉංග්‍රීසි | 1987 | 710 | 2697 |
| එකතුව | 73009 | 7536 | 80545 |

වගුව 1

### 1.2.2. අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 8869 | 12.15 | 561 | 7.44 | 9430 | 11.71 |
| B | 9693 | 13.28 | 739 | 9.81 | 10432 | 12.95 |
| C | 17538 | 24.02 | 1319 | 17.50 | 18857 | 23.41 |
| S | 20895 | 28.62 | 2120 | 28.13 | 23015 | 28.57 |
| F | 16014 | 21.93 | 2797 | 37.12 | 18811 | 23.35 |
| එකතුව | **73009** | **100.00** | **7536** | **100.00** | **80545** | **100.00** |

වගුව 2

## 1.2.3. පළමුවන වතාවට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 9861 | 1532 | 15.54 | 1385 | 14.05 | 2425 | 24.59 | 2601 | 26.38 | 7943 | 80.55 | 1918 | 19.45 |
| 2. ගම්පහ | 6143 | 797 | 12.97 | 741 | 12.06 | 1348 | 21.94 | 1724 | 28.06 | 4610 | 75.04 | 1533 | 24.96 |
| 3. කළුතර | 3010 | 453 | 15.05 | 402 | 13.36 | 671 | 22.29 | 799 | 26.54 | 2325 | 77.24 | 685 | 22.76 |
| 4. මහනුවර | 3633 | 466 | 12.83 | 421 | 11.59 | 823 | 22.65 | 1000 | 27.53 | 2710 | 74.59 | 923 | 25.41 |
| 5. මාතලේ | 1013 | 85 | 8.39 | 102 | 10.07 | 259 | 25.57 | 324 | 31.98 | 770 | 76.01 | 243 | 23.99 |
| 6. නුවරඑළිය | 1334 | 145 | 10.87 | 166 | 12.44 | 323 | 24.21 | 369 | 27.66 | 1003 | 75.19 | 331 | 24.81 |
| 7. ගාල්ල | 2954 | 397 | 13.44 | 406 | 13.74 | 588 | 19.91 | 814 | 27.56 | 2205 | 74.64 | 749 | 25.36 |
| 8. මාතර | 2134 | 220 | 10.31 | 225 | 10.54 | 456 | 21.37 | 668 | 31.30 | 1569 | 73.52 | 565 | 26.48 |
| 9. හම්බන්තොට | 1452 | 106 | 7.30 | 162 | 11.16 | 300 | 20.66 | 410 | 28.24 | 978 | 67.36 | 474 | 32.64 |
| 10. යාපනය | 1378 | 140 | 10.16 | 210 | 15.24 | 348 | 25.25 | 381 | 27.65 | 1079 | 78.30 | 299 | 21.70 |
| 11. කිලිනොච්චි | 202 | 26 | 12.87 | 42 | 20.79 | 51 | 25.25 | 49 | 24.26 | 168 | 83.17 | 34 | 16.83 |
| 12. මන්නාරම | 250 | 27 | 10.80 | 36 | 14.40 | 66 | 26.40 | 64 | 25.60 | 193 | 77.20 | 57 | 22.80 |
| 13. වව්නියාව | 363 | 56 | 15.43 | 54 | 14.88 | 88 | 24.24 | 101 | 27.82 | 299 | 82.37 | 64 | 17.63 |
| 14. මුලතිව් | 162 | 18 | 11.11 | 30 | 18.52 | 45 | 27.78 | 45 | 27.78 | 138 | 85.19 | 24 | 14.81 |
| 15. මඩකලපුව | 810 | 106 | 13.09 | 111 | 13.70 | 204 | 25.19 | 252 | 31.11 | 673 | 83.09 | 137 | 16.91 |
| 16. අම්පාර | 1231 | 119 | 9.67 | 144 | 11.70 | 347 | 28.19 | 359 | 29.16 | 969 | 78.72 | 262 | 21.28 |
| 17. ත්‍රිකුණාමලය | 718 | 67 | 9.33 | 101 | 14.07 | 175 | 24.37 | 203 | 28.27 | 546 | 76.04 | 172 | 23.96 |
| 18. කුරුණෑගල | 3608 | 332 | 9.20 | 407 | 11.28 | 873 | 24.20 | 1037 | 28.74 | 2649 | 73.42 | 959 | 26.58 |
| 19. පුත්තලම | 1682 | 240 | 14.27 | 231 | 13.73 | 399 | 23.72 | 460 | 27.35 | 1330 | 79.07 | 352 | 20.93 |
| 20. අනුරාධපුරය | 1647 | 167 | 10.14 | 199 | 12.08 | 386 | 23.44 | 502 | 30.48 | 1254 | 76.14 | 393 | 23.86 |
| 21. පොළොන්නරුව | 837 | 101 | 12.07 | 90 | 10.75 | 185 | 22.10 | 226 | 27.00 | 602 | 71.92 | 235 | 28.08 |
| 22. බදුල්ල | 1895 | 178 | 9.39 | 223 | 11.77 | 420 | 22.16 | 593 | 31.29 | 1414 | 74.62 | 481 | 25.38 |
| 23. මොණරාගල | 853 | 101 | 11.84 | 88 | 10.32 | 203 | 23.80 | 266 | 31.18 | 658 | 77.14 | 195 | 22.86 |
| 24. රත්නපුරය | 2392 | 330 | 13.80 | 330 | 13.80 | 571 | 23.87 | 586 | 24.50 | 1817 | 75.96 | 575 | 24.04 |
| 25. කෑගල්ල | 1572 | 155 | 9.86 | 188 | 11.96 | 372 | 23.66 | 462 | 29.39 | 1177 | 74.87 | 395 | 25.13 |
| **සමස්ත දිවයින** | **51134** | **6364** | **12.45** | **6494** | **12.70** | **11926** | **23.32** | **14295** | **27.96** | **39079** | **76.42** | **12055** | **23.58** |

වගුව **3**

### 1.2.4. ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 140 | 0.17 | 80545 | 100 |
| 81 - 90 | 3256 | 4.04 | 80405 | 99.83 |
| 71 - 80 | 8583 | 10.66 | 77149 | 95.78 |
| 61 - 70 | 11564 | 14.36 | 68566 | 85.13 |
| 51 - 60 | 13529 | 16.80 | 57002 | 70.77 |
| 41 - 50 | 15208 | 18.88 | 43473 | 53.97 |
| 31 - 40 | 14385 | 17.86 | 28265 | 35.09 |
| 21 - 30 | 9930 | 12.33 | 13880 | 17.23 |
| 11 - 20 | 3743 | 4.65 | 3950 | 4.90 |
| 01 - 10 | 206 | 0.26 | 207 | 0.26 |
| 00 - 00 | 1 | 0.00 | 1 | 0.00 |

වගුව 5

ඉහත වගුව අනුව මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 14385 ක් වන අතර, එය මුළු අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් 17.86% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ගත් අපේක්ෂකයින් සංඛ්‍යාව 28265 කි. එම සංඛ්‍යාව මුළු අපේක්ෂකයින්ගෙන් 35.09% කි.

## 1.3. විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1. I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 2 වන ප්‍රශ්නයට ය. එම ප්‍රශ්නයට ඔවුන් දැක්වූ පහසුතාව 93% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩු ම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 37 වන ප්‍රශ්නයට වන අතර එම ප්‍රශ්නය සඳහා පහසුතාව 4% කි.

### 1.3.2. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයට අනුව 'අ' කොටසේ 1 වන ප්‍රශ්නය, අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනකු තෝරා ගෙන ඇත. එම ප්‍රතිශතය 99% කි. 'අ' කොටසේ 5 වන ප්‍රශ්නය, අඩු ම පිරිසක් තෝරා ගෙන ඇති අතර, එම ප්‍රතිශතය 23% කි.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.3. II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙහි 1 වන ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණය ලකුණු 20කි. මෙම ප්‍රස්තාරයට අනුව එම ලකුණුවලින් 76%-100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 12.8%කි. එමෙන්ම වෙන්කර ඇති ලකුණු 20න් 0%-25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබා ගත් ප්‍රතිශතය 20.8%ක් පමණ වේ.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.4. II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරය අනුව 01 වන ප්‍රශ්නයෙහි (i) කොටසෙහි පහසුතාව 72% ක් වන අතර, 4 වන ප්‍රශ්නයෙහි iv කොටසෙහි (ඊ) අනුකොටසෙහි පහසුතාව 36% කි.




ප්‍රස්තාරය 4.2 (RD/16/04/AL පෝරමයෙන් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1. I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- ⋆ කාලය පැය 02කි.
- ⋆ වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.
- ⋆ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

1. ආර්ථික විද්‍යාවේ දී හදාරනු ලබන්නේ,
   (1) සම්පත් හිඟකම හා පූර්ණ සේවා නියුක්තිය පිළිබඳව ය.
   (2) සම්පත් හිඟකම හා නිෂ්පාදනය පිළිබඳව ය.
   (3) සම්පත් හිඟකම හා තෝරාගැනීම පිළිබඳව ය.
   (4) සම්පත් හිඟකම හා කාර්යක්ෂමතාව පිළිබඳව ය.
   (5) සම්පත් හිඟකම හා ආදේශකතාව පිළිබඳව ය.

2. ආර්ථික විද්‍යාවේ දී ආවස්ථික පිරිවැය වශයෙන් නිර්වචනය කරන්නේ,
   (1) යමක් ලබා ගැනීම වෙනුවෙන් කැප කළ අනෙකුත් අවස්ථායි.
   (2) යමක් ලබා ගැනීම සඳහා වැය වූ මූල්‍ය පිරිවැයයි.
   (3) යමක් ලබා ගැනීම සඳහා ගත වූ කාලයේ පිරිවැයයි.
   (4) යමක් ලබා ගැනීම සඳහා වැය වූ ස්ථාවර හා විචල්‍ය පිරිවැයේ එකතුවයි.
   (5) යමක් ලබා ගැනීම වෙනුවෙන් අත්හරින ලද හොඳම විකල්පයේ වටිනාකමයි.

3. පහත දැක්වෙන ද අතුරෙන් ආර්ථික භාණ්ඩයක ලක්ෂණ නිවැරදි ව පිළිබිඹු කරන පිළිතුර තෝරන්න.
   A - නිෂ්පාදන පිරිවැයක් පැවතීම
   B - ආවස්ථික පිරිවැයක් පැවතීම
   C - පාරිභෝගිකයා විසින් වියදමක් දැරීම
   D - අඩුවන ආන්තික පිරිවැයක් පැවතීම
   (1) A සහ B ය. (2) A සහ C ය. (3) A, B සහ C ය. (4) A, C සහ D ය. (5) B, C සහ D ය.

4. වෙළෙඳපොළ ආර්ථිකයක මිලෙහි කාර්යයන් වන්නේ,
   (1) සලාක කිරීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.
   (2) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.
   (3) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ වටිනාකමේ සන්නිධියක් ලෙස කටයුතු කිරීම ය.
   (4) සානුබල සැපයීම සහ වටිනාකමේ මිනුමක් ලෙස ක්‍රියා කිරීම ය.
   (5) සංඥා සැපයීම, සානුබල සැපයීම සහ සලාක කිරීම ය.

5. වෙළෙඳපොළ ආර්ථිකයක පුද්ගල ආදායම තීරණය වනුයේ,
   (1) රජයේ සාධක මිල ප්‍රතිපත්තිය සහ පිහිටාධාර මත ය.
   (2) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ පෞද්ගලික ආදායම් බදු මත ය.
   (3) සාධක වෙළෙඳපොළේ සාධක මිල සහ රජයේ වැටුප් ප්‍රතිපත්තිය මත ය.
   (4) සාධක වෙළෙඳපොළේ සාධක සඳහා පැවති මිල සහ එම මිලට හුවමාරු වන ප්‍රමාණය මත ය.
   (5) දේපළ හිමිකම සහ සාධක වෙළෙඳපොළේ සාධක මිල මත ය.

6. නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුළත ලක්ෂ්‍යයකින් පෙන්වන්නේ,
   (1) සේවා වියුක්තියයි.
   (2) සම්පත් හිඟකමයි.
   (3) යල්පැන ගිය තාක්ෂණයයි.
   (4) සම්පත් අධි භාවිතයයි.
   (5) නුපුහුණු ශ්‍රමය පැවතීමයි.

7. කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ඉල්ලුම් සමීකරණය පහත දී ඇත.

$$Qd = 200 - 8P$$

   මෙම භාණ්ඩයේ මිල රු. 10 ක් වන විට මිල ඉල්ලුම් නම්‍යතා සංගුණකයේ වටිනාකම කුමක් ද?
   (1) − 6.0 කි. (2) − 0.66 කි. (3) − 0.06 කි. (4) + 0.06 කි. (5) + 0.66 කි.

8. මිල ඉල්ලුම් නම්‍යතාවෙන් මනිනු ලබන්නේ,
   (1) ඉල්ලුම තීරණය කරන සාධකයක වෙනසට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.
   (2) භාණ්ඩයක මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.
   (3) යම් භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය වෙනත් භාණ්ඩයක මිලෙහි ඇතිවන වෙනසකට දක්වන ප්‍රතිචාරයයි.
   (4) නිෂ්පාදන සාධකයක මිලෙහි ඇතිවන සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණය දක්වන ප්‍රතිචාරයයි.
   (5) මිලෙහි සාපේක්ෂ වෙනසකට ඉල්ලුම් ප්‍රමාණයේ ඇතිවන ඉහළ යාමයි.

9. සැපයුම්කරුවකු තම භාණ්ඩයේ මිල 10%කින් ඉහළ දැමීම මගින් අයභාරය ඉහළ දමා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම අරමුණ ඉටුකර ගැනීමට නම් වඩාත් යෝග්‍ය වන්නේ,
   (1) මිල ඉල්ලුම් නම්‍යතාව එකට වඩා අඩු විය යුතු වීම ය.
   (2) මිල ඉල්ලුම් නම්‍යතාව එකට වඩා වැඩි විය යුතු වීම ය.
   (3) මිල ඉල්ලුම් නම්‍යතාව එකට සමාන විය යුතු වීම ය.
   (4) සැපයුමෙහි මිල නම්‍යතාව ශූන්‍ය විය යුතු වීම ය.
   (5) සැපයුමෙහි මිල නම්‍යතාව පූර්ණ නම්‍ය විය යුතු වීම ය.

10. අර්තාපල් සහ බී ලූණු වැනි කෘෂිකාර්මික භාණ්ඩවල වෙළෙඳපොළ මිල වසරේ සමහර කාලවල දී ඉහළ මට්ටමකත්, සමහර කාලවල දී පහළ මට්ටමකත් පවතී. එසේ වීමට ප්‍රධාන හේතුව වන්නේ,
   (1) අනම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
   (2) නම්‍ය ඉල්ලුමක් සහ නම්‍ය සැපයුමක් පැවතීමයි.
   (3) අනම්‍ය ඉල්ලුමක් සහ අනම්‍ය සැපයුමක් පැවතීමයි.
   (4) නම්‍ය ඉල්ලුමක් සහ අනම්‍ය සැපයුමක් පැවතීමයි.
   (5) පූර්ණ නම්‍ය ඉල්ලුමක් සහ පූර්ණ අනම්‍ය සැපයුමක් පැවතීමයි.

11. කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සහ සැපයුම් තොරතුරු පහත වගුවෙන් දැක්වේ.

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 80 | 400 | 800 |
| 100 | 200 | 1000 |

ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර සරල රේඛීය යැ'යි උපකල්පනය කරන්න. මෙම භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද?

| | මිල (රු.) | ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| (1) | 50 | 500 |
| (2) | 60 | 400 |
| (3) | 60 | 600 |
| (4) | 65 | 300 |
| (5) | 70 | 500 |

12. දෙන ලද භාණ්ඩයක සැපයුම් සමීකරණය Qs = 100 + 10P ලෙස දී ඇතැයි සිතන්න. මෙම භාණ්ඩය මත රුපියල් පහක (රු. 5) ඒකක බද්දක් පනවන ලදී. බද්දෙන් පසු සැපයුම් සමීකරණය වන්නේ,
   (1) Qs = 50 + 10P වේ.
   (2) Qs = 100 + 5P වේ.
   (3) Qs = 100 + 15P වේ.
   (4) Qs = 100 + 50P වේ.
   (5) Qs = 500 + 50P වේ.

13. ආයතනයක කෙටිකාලීන නිෂ්පාදන ශ්‍රිතයෙහි ආන්තික ඵලදාව ශූන්‍ය වන විට,
   (1) මුළු ඵලදාව උපරිම වේ.
   (2) සාමාන්‍ය ඵලදාව උපරිම වේ.
   (3) සාමාන්‍ය පිරිවැය අවම වේ.
   (4) ආන්තික පිරිවැය අවම වේ.
   (5) ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාවට සමාන වේ.

14. 'පරිමාණානුකූල ඵල නීතිය' යන්නෙන් අදහස් කෙරෙනුයේ,
   (1) යෙදවුම්වල මිල වෙනස්වන විට ආයතනයක මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.
   (2) අවම වශයෙන් එක් යෙදවුමක් ස්ථාවර ව තිබිය දී විචල්‍ය යෙදවුම් වෙනස් කරන විට ආයතනයක මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.
   (3) තාක්ෂණය වෙනස්වන විට ආයතනයක මුළු නිමවුම වෙනස්වන ආකාරයයි.
   (4) යෙදවුම්වල ගුණාත්මකභාවය වෙනස්වන විට ආයතනයක මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.
   (5) ආයතනයක සියලු යෙදවුම් වෙනස්වන විට මුළු නිමවුම වෙනස් වන ආකාරයයි.

15. කෙටිකාලයේ දී ආයතනයක මුළු පිරිවැය වක්‍රයෙහි හැඩය තීරණය වන්නේ,
   (1) සාමාන්‍ය ස්ථාවර පිරිවැයෙහි හැසිරීම මත ය.
   (2) තාක්ෂණය වෙනස්වන ආකාරය මත ය.
   (3) සාමාන්‍ය මුළු පිරිවැයෙහි හැසිරීම මත ය.
   (4) මුළු විචල්‍ය පිරිවැයෙහි හැසිරීම මත ය.
   (5) පරිමාණානුකූල ඵල හැසිරීම මත ය.

16. ආයතනයක නිමවුම වැඩි කිරීමත් සමඟ සාමාන්‍ය ස්ථාවර පිරිවැය අඛණ්ඩ ව පහත වැටෙන නමුදු එය ශූන්‍ය **නොවන්නේ,**
   (1) මුළු පිරිවැය වෙනස් නොවන බැවිනි.
   (2) විචල්‍ය පිරිවැයක් පවතින බැවිනි.
   (3) සාමාන්‍ය පිරිවැයක් පවතින බැවිනි.
   (4) ආන්තික පිරිවැයක් පවතින බැවිනි.
   (5) ස්ථාවර පිරිවැයක් පවතින බැවිනි.

17. ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය වන්නේ,
   (1) ආන්තික පිරිවැය වක්‍රයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉක්ම වූ කොටසයි.
   (2) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ ඉහළ යන කොටසයි.
   (3) ආන්තික පිරිවැය වක්‍රයේ ඉහළ යන කොටසයි.
   (4) සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ ඉහළ යන කොටසයි.
   (5) ආන්තික පිරිවැය වක්‍රයේ සාමාන්‍ය මුළු පිරිවැය ඉක්ම වූ කොටසයි.

18. සමජාතීය හෝ ප්‍රභේදිත භාණ්ඩ සපයන විශාල ආයතන ස්වල්ප සංඛ්‍යාවක් සිටින විට එය,
(1) ද්විඅධිකාරී වෙළෙඳපොළකි. (2) ඒකාධිකාරී තරග වෙළෙඳපොළකි.
(3) පූර්ණ තරගකාරී වෙළෙඳපොළකි. (4) කතිපයාධිකාරී වෙළෙඳපොළකි.
(5) ඒකාධිකාරී වෙළෙඳපොළකි.

19. පූර්ණ තරගකාරී ආයතනයක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක් වන්නේ,
(1) වෙළෙඳපොළේ සමජාතීය භාණ්ඩ අලෙවි කරන බැවිනි.
(2) සැපයුම්කරු මිල තීරණය කරන්නකු බැවිනි.
(3) සැපයුම්කරු මිල ගනුවකු බැවිනි.
(4) සැපයුම්කරුට අවශ්‍ය තොරතුරු නොලැබෙන බැවිනි.
(5) ප්‍රචාරණ කටයුතු සිදු නොකරන බැවිනි.

20. ඒකාධිකාරී ආයතනයකට තීරණය කළ හැකිවන්නේ,
(1) භාණ්ඩයක මිල පමණි. (2) භාණ්ඩයක මිල හෝ සැපයුම් ප්‍රමාණය හෝ පමණි.
(3) භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය පමණි. (4) භාණ්ඩයක මිල හා සැපයුම් ප්‍රමාණය යන දෙකම වේ.
(5) භාණ්ඩයක නිෂ්පාදන පිරිවැය හා සැපයුම් ප්‍රමාණය යන දෙකම වේ.

21. ආයතනයක සමතුලිතය තීරණය වීමේ දී ඉටුවිය යුතු කොන්දේසිය වන්නේ,
(1) ආන්තික පිරිවැය වැඩි වෙමින් පවතින අවධියේ දී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
(2) ආන්තික පිරිවැය අඩු වෙමින් පවතින අවධියේ දී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
(3) ආන්තික පිරිවැය අවම වන ලක්ෂ්‍යයේ දී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
(4) සාමාන්‍ය පිරිවැය වැඩිවෙමින් පවතින අවධියේ දී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.
(5) සාමාන්‍ය පිරිවැය අඩුවෙමින් පවතින අවධියේ දී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමාන වීමයි.

22. ව්‍යාපාර චක්‍රයක පතුලෙහි සිට මුදුනත දක්වා ගමන් කරන විට දැකිය හැකි ලක්ෂණ වන්නේ,
(1) සත්‍ය නිමවුම වැඩි වීම, උද්ධමනය සහ සේවා වියුක්තිය අඩු වීම ය.
(2) සත්‍ය නිමවුම වැඩි වීම, සේවා නියුක්තිය සහ උද්ධමනය අඩු වීම ය.
(3) සත්‍ය නිමවුම වැඩි වීම, සේවා නියුක්තිය සහ උද්ධමනය වැඩි වීම ය.
(4) විභව නිමවුම වැඩි වීම, උද්ධමනය අඩු වීම සහ සේවා වියුක්තිය වැඩි වීම ය.
(5) සත්‍ය නිමවුම වැඩි වීම, විභව නිමවුම වැඩි වීම සහ උද්ධමනය අඩු වීම ය.

23. කල්පිත ආර්ථිකයක ජාතික ආදායම සම්බන්ධ දත්ත පහත දැක්වේ. (සියලු ම අගයන් රුපියල් මිලියනවලිනි)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 1 200 |
| පෞද්ගලික ආයෝජන වියදම | 400 |
| රජයේ මිල දී ගැනීම් | 300 |
| අපනයන ඉපයුම් | 180 |
| දළ දේශීය නිෂ්පාදිතය | 1 920 |

මෙම ආර්ථිකයේ වෙළෙඳ ශේෂයේ අගය කුමක් ද?
(1) රුපියල් මිලියන −160 කි. (2) රුපියල් මිලියන −20 කි. (3) රුපියල් මිලියන 20 කි.
(4) රුපියල් මිලියන 80 කි. (5) රුපියල් මිලියන 160 කි.

24. කල්පිත ආර්ථිකයක නාමික දළ දේශීය නිෂ්පාදනයේ වර්ධන වේගය 13.5% ක් ද, උද්ධමන අනුපාතිකය 6% ක් ද, ජනගහන වර්ධන අනුපාතිකය 1.2% ක් ද යැ'යි සිතන්න. මෙම ආර්ථිකයේ මූර්ත ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය කුමක් ද?
(1) −1.2% කි. (2) 1.05% කි. (3) 6.3% කි. (4) 7.05% කි. (5) 7.5% කි.

25. ආර්ථිකයක කිසියම් වර්ෂයක දී දළ ජාතික නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් මත ගණනය කළ විට, එය පදනම් වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතයේ අගයට වඩා වැඩි විය හැක්කේ,
(1) පොදු මිල මට්ටමේ පහළ යාමත්, සේවා වියුක්තියේ ඉහළ යාමත් හේතුවෙනි.
(2) පොදු මිල මට්ටමේ ඉහළ යාමත්, නිමවුමේ පහළ යාමත් හේතුවෙනි.
(3) පොදු මිල මට්ටමේ පහළ යාමත්, නිමවුමේ ඉහළ යාමත් හේතුවෙනි.
(4) පොදු මිල මට්ටම, නිමවුම ඉහළ යන වේගයට වඩා වැඩි වේගයකින් ඉහළ යාම හේතුවෙනි.
(5) පොදු මිල මට්ටමේ ඉහළ යාමත්, සේවා වියුක්තියේ පහළ යාමත් හේතුවෙනි.

26. මුදල් සැපයුම සහ ආදායම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
  (1) මුදල් සැපයුම හා ආදායම යන දෙක ම ප්‍රවාහයන් හා තොගයන් වීම ය.
  (2) මුදල් සැපයුම ප්‍රවාහයක් වන අතර ආදායම තොගයක් වීම ය.
  (3) මුදල් සැපයුම හා ආදායම යන දෙක ම ප්‍රවාහයන් වීම ය.
  (4) මුදල් සැපයුම හා ආදායම යන දෙක ම තොගයන් වීම ය.
  (5) මුදල් සැපයුම තොගයක් වන අතර ආදායම ප්‍රවාහයක් වීම ය.

27. රටක මුදල් ඉල්ලුම තීරණය වන්නේ,
  (1) පොලී අනුපාතිකය සහ අධිබලැති මුදල් ප්‍රමාණය මත ය.
  (2) මුදල් ගුණකයේ අගය සහ පොලී අනුපාතිකය මත ය.
  (3) පොලී අනුපාතිකය සහ සේවා වියුක්තිය මත ය.
  (4) මූර්ත ආදායම සහ පොලී අනුපාතිකය මත ය.
  (5) අධිබලැති මුදල් ප්‍රමාණය සහ මුදල් ගුණකයේ අගය මත ය.

28. මිල මට්ටමේ පහළ යාමකින්,
  (1) මුදලේ වටිනාකමට බලපෑමක් සිදු නොවේ.
  (2) මුදලේ වටිනාකම වැඩි වේ.
  (3) මුදලේ වටිනාකමට දිගුකාලීන බලපෑමක් ඇති නොවේ.
  (4) මුදලේ වටිනාකමට කෙටිකාලයේ දී කිසිදු බලපෑමක් සිදු නොවේ.
  (5) මුදලේ වටිනාකම අඩු වේ.

29. ශ්‍රී ලංකාවේ මුදල් සැපයුමේ $M_{2b}$ සකස් වන්නේ,
  (1) අධිබලැති මුදල්වලට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.
  (2) ඉල්ලුම් තැන්පතුවලට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.
  (3) ස්ථාවර තැන්පතුවලට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.
  (4) පටු මුදල් සැපයුමට වාණිජ බැංකුවල කාලීන හා ඉතුරුම් තැන්පතු එකතු වීමෙනි.
  (5) පුළුල් මුදල් සැපයුමට විදේශ මුදල් තැන්පතු එකතු වීමෙනි.

30. විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික ස්ථායිතාව වඩාත් හොඳින් පිළිබිඹු කරන්නේ,
  (1) මිල මට්ටම සහ විදේශ විනිමය අනුපාතිකය මගිනි.
  (2) මිල මට්ටම සහ සේවා නියුක්ති අනුපාතිකය මගිනි.
  (3) විදේශ විනිමය අනුපාතිකය සහ සේවා නියුක්ති අනුපාතිකය මගිනි.
  (4) ගෙවුම් ශේෂය සහ විදේශ විනිමය අනුපාතිකය මගිනි.
  (5) උද්ධමනය සහ සේවා වියුක්ති අනුපාතිකය මගිනි.

31. ආර්ථිකයක පොලී අනුපාතිකය පහත හෙළීමෙන් ළඟා කර ගැනීමට බලාපොරොත්තුවන සාර්ව ආර්ථික අරමුණක් වන්නේ,
  (1) ආයෝජන වැඩි වී මිල මට්ටම ඉහළ ගොස් පරිභෝජනය අඩු වීමයි.
  (2) ආයෝජන ඉහළ යාම හේතුවෙන් සමාහාර ඉල්ලුම ඉහළ ගොස් ආර්ථිකයේ නිෂ්පාදනය වැඩි වීමයි.
  (3) පරිභෝජනය සහ ආයෝජන ඉහළ ගොස් ආයතන ලාභ ඉහළ යාමයි.
  (4) ඉතුරුම් වැඩි වී පරිභෝජනය අඩු වී රජයේ බදු ආදායම ඉහළ යාමයි.
  (5) කොටස් මිල ඉහළ ගොස් ව්‍යාපාරික ලාභ වැඩි වී නව ආයෝජන බිහි වීමයි.

32. ප්‍රසාරණාත්මක මූල්‍ය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා උදාහරණ වන්නේ,
  (1) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කිරීම සහ බදු අනුපාතික පහත හෙළීම ය.
  (2) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳපොළේ රජයේ සුරැකුම්පත් විකිණීම සහ බදු අනුපාතික පහත හෙළීම ය.
  (3) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කිරීම සහ රජයේ මිල දී ගැනීම් ඉහළ දැමීම ය.
  (4) මහ බැංකුව විසින් විවෘත වෙළෙඳපොළේ රජයේ සුරැකුම්පත් මිල දී ගැනීම සහ බදු අනුපාතික පහත හෙළීම ය.
  (5) පොලී අනුපාතිකය ඉහළ දැමීම සහ රජයේ මිල දී ගැනීම් ඉහළ දැමීම ය.

33. පොදු භාණ්ඩ, වෙළෙඳපොළ ක්‍රමය මඟින් සපයනු **නොලබන්නේ,**
  (1) පරිභෝජනයේ දී පිරිවැයක් ඇති වුව ද, ලාභයක් ඉපයීමට නොහැකි නිසා ය.
  (2) මිලක් අය කළ නොහැකි වීම සහ පරිභෝජනයේ දී තරගකාරීත්වයක් නොපැවතීම නිසා ය.
  (3) මිලක් නොගෙවන අය පරිභෝජනයෙන් බැහැර කළ නොහැකි වීම සහ පරිභෝජනයේ දී තරගකාරීත්වයක් නොපැවතීම නිසා ය.
  (4) ලාභයක් ඉපයිය හැකි වුව ද පරිභෝජනයේ දී පිරිවැයක් පැවතීම නිසා ය.
  (5) මිලක් අය කළ හැකි වුවත් එය පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා ය.

34. "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස මෑත වර්ෂවල දී පහත බැසීමේ උපනතියක් පෙන්නුම් කරයි." මෙයට ප්‍රධාන හේතුව වන්නේ,
   (1) දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර ව පැවතිය දී රාජ්‍ය ණය පහළ යාම ය.
   (2) රාජ්‍ය ණය පහළ යාම සහ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.
   (3) රාජ්‍ය ණය සහ දළ දේශීය නිෂ්පාදිතය යන දෙක ම පහළ යාම ය.
   (4) රාජ්‍ය ණය ස්ථාවර ව පැවතිය දී දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.
   (5) රාජ්‍ය ණය ඉහළ යාමට වඩා දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යාම ය.

35. පෞද්ගලික ප්‍රතිලාභවලට වඩා වැඩි සමාජ ප්‍රතිලාභ පවතින්නේ,
   (1) අධ්‍යාපනය සහ සෞඛ්‍ය යන සේවාවන්වල ය.
   (2) යටිතල පහසුකම් සහ පරිසර සංරක්ෂණ කටයුතුවල ය.
   (3) වරාය සහ ගුවන්තොටුපල සේවාවන්වල ය.
   (4) මහාමාර්ග සහ රෝහල් සේවාවන්වල ය.
   (5) ජාතික උද්‍යාන සහ පරිසර සංරක්ෂණ කටයුතුවල ය.

36. නිෂ්පාදනය දිරිගන්වන සැපයුම්-පාර්ශවීය (supply-side) ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වන්නේ,
   (1) නිෂ්පාදන සහනාධාර, නියාමනහරණය, බදු ප්‍රතිසංස්කරණ සහ ජනසතුකරණය ය.
   (2) බදු ප්‍රතිසංස්කරණ, ජනසතුකරණය, නියාමනහරණය සහ ශ්‍රම හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල දෘඪතා ඉවත් කිරීම ය.
   (3) නියාමනකරණය, බදු ප්‍රතිසංස්කරණ, පරිපාලන හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සහ ශ්‍රම හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල ප්‍රතිසංස්කරණ කිරීම ය.
   (4) නිෂ්පාදන සහනාධාර, පරිපාලන හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම, නියාමනහරණය සහ වෙළෙඳ සීමා පැනවීම ය.
   (5) බදු ප්‍රතිසංස්කරණ, පෞද්ගලීකරණය, නියාමනහරණය සහ ශ්‍රම හා ප්‍රාග්ධන වෙළෙඳපොළවල ප්‍රතිසංස්කරණ කිරීම ය.

37. මෑත වර්ෂවල ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ වර්ධන වේගයක් වාර්තා කර ඇති අංශ වන්නේ,
   (1) ප්‍රවාහනය, තොග හා සිල්ලර වෙළෙඳාම සහ තොරතුරු හා සන්නිවේදනය වේ.
   (2) සංචාරක කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය සහ මැණික් හා ස්වර්ණාභරණ වේ.
   (3) ඉදිකිරීම් කර්මාන්තය, හෝටල් හා ආපනශාලා සහ පතල් හා කැණීම් වේ.
   (4) ඉදිකිරීම් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තය සහ තොග හා සිල්ලර වෙළෙඳාම වේ.
   (5) හෝටල් හා ආපනශාලා, සංචාරක කර්මාන්තය සහ ප්‍රවාහනය වේ.

38. නිරපේක්ෂ සහ සාපේක්ෂ දරිද්‍රතා මැන බැලීම සඳහා යොදාගත හැකි දර්ශක දෙක පිළිවෙළින්,
   (1) ජිනි සංගුණකය සහ ගෘහස්ත විදුලි පරිභෝජනයයි.
   (2) ආදායමේ දශක කොටස් (income percentiles) සහ ජිනි සංගුණකයයි.
   (3) කුටුම්භ ආදායම් මට්ටම සහ ආරක්ෂිත පානීය ජල සැපයුමයි.
   (4) දරිද්‍රතා ඉම (poverty line) සහ ජිනි සංගුණකයයි.
   (5) මාතෘ පෝෂණය සහ ආරක්ෂිත පානීය ජල සැපයුමයි.

39. කිසියම් භාණ්ඩයක වෙළෙඳපොළ සමතුලිතය සහ ආනයනික සැපයුම පහත රූප සටහනෙන් දැක්වේ.




මෙම රූප සටහනට අනුව, ආනයනික සැපයුම හේතුවෙන් සමාජයට ලැබෙන අමතර වාසිය දැක්වෙන ප්‍රදේශය වන්නේ,
   (1) A හා B ය.
   (2) B හා C ය.
   (3) B හා G ය.
   (4) C හා F ය.
   (5) G, C හා F ය.

40. පහත සඳහන් කරුණු අතුරෙන් රටවල් අතර වෙළෙඳාමක් හට ගැනීමට හේතුවක් **නොවන්නේ**,

(1) රටවල් අතර සාධක උරුමය වෙනස් වීමයි.

(2) රටවල් අතර විදේශ විනිමය අනුපාතික වෙනස් වීමයි.

(3) රටවල් අතර තාක්ෂණික දැනුම වෙනස් වීමයි.

(4) නිෂ්පාදනයේ පරිමාණානුකූල ඵල පැවතීමයි.

(5) රටවල් අතර පාරිභෝගික රුචිය සහ තෝරා ගැනීමේ වෙනස් වීමයි.

41. කිසියම් ආර්ථිකයක් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | ඒක පුද්ගල ආදායම (ඇ.එ.ජ. ඩොලර් වලින්) | ජිනි සංගුණකය |
|---|---|---|
| 2011 | 2 400 | 0.46 |
| 2012 | 2 800 | 0.47 |
| 2013 | 3 200 | 0.48 |

මෙම ආර්ථිකය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ආර්ථික ප්‍රසාරණයක් සමඟ ආදායම් විෂමතාව අඩු වීමක් ඇති බවයි.

(2) ආර්ථික සංකෝචනයක් සමඟ ආදායම් විෂමතාව වැඩි වීමක් ඇති බවයි.

(3) ආර්ථික සංකෝචනයක් සමඟ ආදායම් විෂමතාව අඩු වීමක් ඇති බවයි.

(4) ආර්ථික ප්‍රසාරණයක් සමඟ ආදායම් විෂමතාව වැඩි වීමක් ඇති බවයි.

(5) ආර්ථික ප්‍රසාරණයක් හෝ ආදායම් විෂමතාවයේ අඩු වීමක් නොමැති බවයි.

42. තිරසාර සංවර්ධනයේ ප්‍රධාන පැතිකඩ වන්නේ,

(1) ආර්ථික සංවර්ධනය, අනාගත පරම්පරා සඳහා සම්පත් ඉතිරි කිරීම සහ ආදායම් විෂමතාව අවම වීමයි.

(2) ආර්ථික සංවර්ධනය, සමාජ තත්ත්වය උසස් වීම සහ ආදායම් විෂමතාව අවම වීමයි.

(3) සමාජ තත්ත්වය උසස් වීම, දිළින්දන්ට හිතකර වර්ධනය සහ පරිසර සංරක්ෂණයයි.

(4) පරිසර සංරක්ෂණය, අන්තර්ගත වර්ධනය (Inclusive growth) සහ සේවා නියුක්තිය ඉහළ යාමයි.

(5) ආර්ථික සංවර්ධනය, සමාජ තත්ත්වය උසස් වීම සහ පරිසර සංරක්ෂණයයි.

43. යම් දෙන ලද යෙදවුම් ප්‍රමාණයකින් ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට ලබාගත හැකි නිමවුම් ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| තේ (ඒකක) | 100 | 90 |
| ඇඟලුම් (ඒකක) | 120 | 100 |

ඉහත තොරතුරුවලට අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) තේ නිෂ්පාදනයේ සාපේක්ෂ අවාසිය පවතින්නේ ඉන්දියාවට ය.

(2) ඇඟලුම් නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය පවතින්නේ ශ්‍රී ලංකාවට ය.

(3) තේ නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසිය පවතින්නේ ඉන්දියාවට ය.

(4) රටවල් දෙකට ම භාණ්ඩ දෙක ම නිෂ්පාදනය සම්බන්ධයෙන් සාපේක්ෂ වාසියක් පවතී.

(5) භාණ්ඩ දෙක ම සම්බන්ධයෙන් ඉන්දියාවට සාපේක්ෂ වාසියක් නොමැත.

44. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපයීමේ ප්‍රධාන මූලාශ්‍ර **පහ** මොනවා ද?

(1) ඇඟලුම්, තේ, පොල්, මැණික් සහ පරිගණක මෘදුකාංග

(2) ඇඟලුම්, තේ, පොල්, රබර් සහ පරිගණක මෘදුකාංග

(3) ආමුඛ ප්‍රේෂණ, ඇඟලුම්, සංචාරක ඉපයුම්, තේ සහ රබර්

(4) ආමුඛ ප්‍රේෂණ, ඇඟලුම්, පරිගණක මෘදුකාංග, සංචාරක ඉපයුම් සහ තේ

(5) මැණික් හා ස්වර්ණාභරණ, තේ, පොල්, රබර් සහ ඛනිජ

45. පහත දැක්වෙන අය අතුරෙන් සේවා වියුක්තිකයකු ලෙස සැලකිය හැකි වන්නේ කවරකු ද?

(1) උපාධිය සමත් වී ලිපිකරුවකු ලෙස පෞද්ගලික අංශයේ සේවය කරන පුද්ගලයෙකි.

(2) වයස්ගත දෙමාපියන් රැකබලා ගැනීම සඳහා රැකියාව අත්හළ පුද්ගලයෙකි.

(3) උසස් අධ්‍යාපනය සඳහා ස්ථිර රැකියාවෙන් ඉවත් වූ පුද්ගලයෙකි.

(4) දරුවන් රැකබලා ගැනීම සඳහා නිවසේ රැඳී සිටි නමුත් දැන් රැකියාවක් සොයන කාන්තාවකි.

(5) විභාග කාල සීමාවේ දී තම පවුලේ ගොවිපොළෙහි වැඩෙහි නිරත නොවන පාසල් සිසුවෙකි.

46. මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයෙහි ඇති වූ ප්‍රධාන වෙනස්කමක් වන්නේ,
   (1) ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ යාම ය.
   (2) ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ යාම ය.
   (3) පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ යාම ය.
   (4) ස්ත්‍රී සේවා නියුක්තිය පහළ යාම ය.
   (5) පුරුෂ සේවා වියුක්තිය සැලකිය යුතු මට්ටමකින් ඉහළ යාම ය.

47. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකය කෙටි කලකින් ඉහළ නැංවීම සඳහා තවදුරටත් අවධානය යොමු කළ යුතු අනු දර්ශක කවරේ ද?
   (1) ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සහ උපතේ දී ආයු අපේක්ෂණය
   (2) සාක්ෂරතා අනුපාතිකය සහ මාතෘ මරණ අනුපාතිකය
   (3) මාතෘ මරණ අනුපාතිකය සහ ළදරු මරණ අනුපාතිකය
   (4) ඒක පුද්ගල ආදායම සහ පාසල් හැරයන්නන්ගේ අනුපාතිකය
   (5) අධ්‍යාපනයේ සහභාගීත්ව අනුපාතිකය සහ ක්‍රය ශක්ති සාම්‍ය මිල මත ගණනය කළ ඒක පුද්ගල ආදායම

48. 2012 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය, සේවා වියුක්ති අනුපාතිකය සහ උද්ධමන අනුපාතිකය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

| | ආර්ථික වර්ධන අනුපාතිකය (%) | සේවා වියුක්ති අනුපාතිකය (%) | උද්ධමන අනුපාතිකය (%) |
|---|---|---|---|
| (1) | 5.6 | 5.5 | 8.0 |
| (2) | 7.5 | 6.0 | 4.0 |
| (3) | 7.0 | 8.9 | 9.0 |
| (4) | 6.4 | 4.0 | 7.6 |
| (5) | 8.3 | 8.9 | 4.0 |

49. ශ්‍රී ලංකාවේ නුපුහුණු කාන්තා ශ්‍රමිකයින් මැද පෙරදිග රටවලට රැකියා සඳහා සංක්‍රමණය වීමේ දී ඇතිවන අහිතකර ප්‍රතිවිපාක අවම කර ගැනීම සඳහා රජය විසින් මෑත කාලයේ දී ගෙන ඇති ප්‍රතිපත්ති තීරණ වන්නේ,
   (1) සේවය කළ හැකි උපරිම කාලය තීරණය කිරීම සහ අනේවාසික ගිණුමේ පවත්වාගෙන යා යුතු අවම ශේෂය තීරණය කිරීම ය.
   (2) අනේවාසික විදේශ විනිමය ගිණුමක් විවෘත කිරීම සහ අවම වශයෙන් වසර තුනක සේවා ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම ය.
   (3) අවම වයස් සීමාව තීරණය කිරීම සහ පවුල් පසුබිම පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම ය.
   (4) අවම වයස් සීමාව තීරණය කිරීම සහ අවම වශයෙන් වසර තුනක සේවා ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම ය.
   (5) අනේවාසික විදේශ විනිමය ගිණුමක් විවෘත කිරීම සහ විදේශගත ව සේවය කළ හැකි උපරිම කාලය තීරණය කිරීම ය.

50. ගෝලීයකරණයේ ප්‍රධාන ගාමක බලවේග ලෙස සැලකෙන්නේ,
   (1) ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය සහ ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යාම ය.
   (2) ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති ඉවත් කිරීම සහ තාක්ෂණයේ වර්ධනය ය.
   (3) බහුජාතික සමාගම්වල ව්‍යාප්තිය සහ ශ්‍රම වෙළෙඳපොළේ දෘඩතා පැවතීම ය.
   (4) ආර්ථික ඒකාබද්ධ වීම සහ ආරක්ෂණවාදී වෙළෙඳ ප්‍රතිපත්ති පවත්වාගෙන යාම ය.
   (5) වෙළෙඳපොළ නියාමනහරණය සහ අපූර්ණ තරගයක් පැවතීම ය.

**2.1.3. I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 3 | 26. | 5 |
| 02. | 5 | 27. | 4 |
| 03. | 3 | 28. | 2 |
| 04. | 5 | 29. | 5 |
| 05. | 4 | 30. | 1 |
| 06. | 1 | 31. | 2 |
| 07. | 2 | 32. | 4 |
| 08. | 2 | 33. | 3 |
| 09. | 1 | 34. | 5 |
| 10. | 3 | 35. | 1 |
| 11. | 3 | 36. | 5 |
| 12. | 1 | 37. | 3 |
| 13. | 1 | 38. | 4 |
| 14. | 5 | 39. | 4 |
| 15. | 4 | 40. | 2 |
| 16. | 5 | 41. | 4 |
| 17. | 1 | 42. | 5 |
| 18. | 4 | 43. | 2 |
| 19. | 3 | 44. | 3 |
| 20. | 2 | 45. | 4 |
| 21. | 1 | 46. | 1 |
| 22. | 3 | 47. | 5 |
| 23. | 3 | 48. | 4 |
| 24. | 3 | 49. | 3 |
| 25. | 3 | 50. | 2 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් ලකුණු **100** කි.

## 2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ




ඉහත ප්‍රස්තාරයට අනුව, I ප්‍රශ්න පත්‍රය සැලකීමේදී පහසුතාව අඩුම ප්‍රශ්නය, 37 වන ප්‍රශ්නය වේ. එහි පහසුතාව 4%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් අඩු ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇත්තේ 37 වන ප්‍රශ්නයට ය. එසේම පහසුතාව වැඩිම ප්‍රශ්නය වන්නේ, 2 වන ප්‍රශ්නය වන අතර, එහි පහසුතාව 93%කි. එනම්, අයදුම්කරුවන් අතුරෙන් වැඩි ම ප්‍රතිශතයක් නිවැරදි ව පිළිතුරු සපයා ඇති ප්‍රශ්නය 2 වන ප්‍රශ්නයටය.

සමස්ත ප්‍රශ්න පත්‍රය සැලකීමේදී I ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 55.39%ක් වේ.

## 2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **4** | **5** | **Missing** |
| 1 | 3 | 4% | 10% | 81% | 4% | **1**% | - |
| 2 | 5 | 3% | **1**% | 0% | 2% | 93% | - |
| 3 | 3 | 34% | **3**% | 60% | 2% | 1% | - |
| 4 | 5 | 2% | 5% | 6% | **3**% | 85% | - |
| 5 | 4 | 2% | 10% | 9% | 41% | **39**% | 1% |
| 6 | 1 | 77% | 13% | 2% | 2% | **5**% | - |
| 7 | 2 | 5% | 66% | 13% | 7% | **9**% | - |
| 8 | 2 | 4% | 77% | 8% | **8**% | 3% | - |
| 9 | 1 | 55% | 21% | 7% | 7% | **10**% | - |
| 10 | 3 | 26% | **14**% | 25% | 25% | 10% | - |
| 11 | 3 | 4% | 8% | 84% | **2**% | 2% | - |
| 12 | 1 | 66% | **5**% | 13% | 11% | 4% | - |
| 13 | 1 | 33% | 14% | 10% | 16% | 26% | - |
| 14 | 5 | **6**% | 32% | 3% | 5% | 54% | - |
| 15 | 4 | 9% | 3% | **18**% | 59% | 11% | - |
| 16 | 5 | 6% | 14% | **7**% | 17% | 55% | - |
| 17 | 1 | 49% | **11**% | 17% | 8% | 15% | - |
| 18 | 4 | 3% | **26**% | 11% | 58% | 3% | - |
| 19 | 3 | 29% | 6% | 61% | 2% | **2**% | - |
| 20 | 2 | 13% | 16% | 4% | 59% | **8**% | - |
| 21 | 1 | 36% | 10% | 36% | **10**% | 8% | - |
| 22 | 3 | 27% | 11% | 42% | **9**% | 11% | - |
| 23 | 3 | 17% | 8% | 50% | 5% | **19**% | - |
| 24 | 3 | **4**% | 10% | 57% | 12% | 16% | 1% |
| 25 | 3 | 7% | **9**% | 37% | 35% | 12% | 1% |
| 26 | 5 | 6% | 12% | **21**% | 4% | 57% | 1% |
| 27 | 4 | 13% | 10% | 4% | 62% | 11% | - |
| 28 | 2 | 13% | 43% | **8**% | 14% | 22% | - |
| 29 | 5 | 5% | 3% | 3% | 20% | 69% | - |
| 30 | 1 | 22% | 16% | **14**% | 42% | 5% | - |
| 31 | 2 | 5% | 72% | 9% | **5**% | 8% | - |
| 32 | 4 | **8**% | 14% | 8% | 61% | 9% | 1% |
| 33 | 3 | **14**% | 28% | 48% | 4% | 5% | 1% |
| 34 | 5 | 8% | **19**% | 8% | 10% | 54% | 1% |
| 35 | 1 | 65% | **17**% | 3% | 9% | 6% | - |
| 36 | 5 | 17% | 13% | **22**% | 18% | 30% | - |
| 37 | 3 | 11% | 24% | 4% | 29% | **32**% | - |
| 38 | 4 | 6% | 11% | **8**% | 73% | 2% | 1% |
| 39 | 4 | 3% | 14% | **4**% | 75% | 4% | - |
| 40 | 2 | 11% | 48% | 3% | **26**% | 12% | - |
| 41 | 4 | 16% | 5% | 4% | 68% | 7% | - |
| 42 | 5 | 31% | **8**% | 6% | 4% | 51% | - |
| 43 | 2 | 8% | 49% | 8% | 13% | 23% | - |
| 44 | 3 | 7% | **11**% | 57% | 12% | 13% | - |
| 45 | 4 | **5**% | 17% | 7% | 60% | 11% | - |
| 46 | 1 | 72% | **9**% | 7% | 6% | 6% | - |
| 47 | 5 | **14**% | 12% | 19% | 11% | 45% | 1% |
| 48 | 4 | 5% | **11**% | 7% | 64% | 12% | - |
| 49 | 3 | **5**% | 7% | 57% | 22% | 9% | - |
| 50 | 2 | 10% | 49% | 13% | 24% | 5% | - |

∗ එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු පසුබිමෙහි දක්වා ඇත.

∗ Missing යනුවෙන් දක්වා ඇත්තේ, ප්‍රශ්නය සඳහා වරණ තෝරා නැති හෝ එක් වරණයකට වඩා වැඩියෙන් වරණ තෝරා ඇති හෝ ශිෂ්‍ය ප්‍රතිශතයයි.

### 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

- සමස්තයක් ලෙස සලකා බලන විට, බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත I වන ප්‍රශ්න පත්‍රයේ අංක 01, 02, 04, 06, 07, 08, 11, 12, 19, 27, 29, 31, 32, 35, 38, 39, 41, 46, 48 යන ප්‍රශ්න සඳහා අපේක්ෂකයින්ගෙන් අවම වශයෙන් 60% ඉක්ම වූ ප්‍රතිශතයක් නිවැරදිව පිළිතුරු සපයා ඇත. එසේ නිවැරදි පිළිතුරු ලියන ලද ප්‍රශ්න සංඛ්‍යාව 19 කි.

- අංක 10, 13, 20, 21, 25, 30, 36, 37 යන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ සමස්ත අපේක්ෂකයින් අතරින් 40% කට අඩු ප්‍රතිශතයකි.

- 10 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 25% කි. අර්තාපල්, බී ලූණු වැනි කෘෂිකාර්මික භාණ්ඩවල ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව පිළිබඳවත් එම නම්‍යතා මත කෘෂිකාර්මික භාණ්ඩවල මිල උච්චාවචනය වන ආකාරයත් පිළිබඳව ප්‍රශ්නය මගින් විමසීමට ලක් කරයි. නමුත් අදාළ මාතෘකාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා එම දැනුම භාවිත කිරීමේ අවබෝධය නොමැති බව පෙනී යන්නේ 75% ක් ප්‍රශ්නය දුෂ්කරතාවට පත් වීමෙනි. එබැවින් උක්ත මාතෘකාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් සිසුන්ට ලබා දිය යුතුයි.

- 13 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 33% කි. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියක විචල්‍ය යෙදවුම් වෙනස් කරන විට මුළු ඵලදා වක්‍රය හා ආන්තික ඵලදා වක්‍රය හැසිරෙන ආකාරය පිළිබඳවය. සිසුන් හට 67% ක දුෂ්කරතා මට්ටමක් පැවතීම මගින් පෙන්වන්නේ අපේක්ෂකයින් වැඩි ප්‍රතිශතයකට උක්ත මාතෘකාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් නොමැති බවය. එහෙයින් එම මාතෘකාව පිළිබඳ දැනුම, අවබෝධය හා භාවිතය පිළිබඳ කුසලතා සිසුන් තුළ වර්ධනය කළ යුතුය.

- 20 වන ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ ඒකාධිකාරී ආයතනයක වෙළෙඳපොළ බලය පිළිබඳවය. අපේක්ෂකයින්ගෙන් 16% ක් පමණ නිවැරදි පිළිතුරු සැපයීම මගින් පෙන්නුම් කරන්නේ එම ප්‍රශ්නය බහුතරයකට දුෂ්කර වූ බවයි. ඒකාධිකාරී වෙළෙඳපොළ ව්‍යුහයේ ලක්ෂණ හා ඒකාධිකාරි ආයතනයක වෙළෙඳපොළ බලය පිළිබඳ ප්‍රමාණවත් දැනුම සිසුන්ට ලබා දිය යුතුයි.

- 21 වන ප්‍රශ්නය අපේක්ෂකයින් වැඩි දෙනෙකුට දුෂ්කර වූ ප්‍රශ්නයකි. මේ ප්‍රශ්නයේ දුෂ්කරතා දර්ශකය 64% ක් වීමෙන් ඒ බව තහවුරු වේ. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ ආයතනයක සමතුලිතතාව තීරණය වන ප්‍රධාන කොන්දේසි පිළිබඳවය. ආයතනයක් සමතුලිත වන විට එනම් ලාභ උපරිම වන නිමැවුම තීරණය කරන විට ඉහළ නගින ආන්තික පිරිවැය, ආන්තික අයභාරයට සමාන විය යුතු බව සිසුන්ට ප්‍රස්තාර හා සංඛ්‍යාත්මක වගු මගින් අවබෝධ කළ යුතුය.

- 25 වන ප්‍රශ්නයේ පහසුතාව 37% ක මට්ටමක පැවතීම මගින් පෙන්වන්නේ අපේක්ෂකයින් වැඩි දෙනෙකුට ප්‍රශ්නය අපහසුතාවක් ඇති කළ බවයි. ප්‍රශ්නය මගින් විමසන්නේ සලකා බලන වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් මත ඇස්තමේන්තු කරන ආකාරය හා එය පාද වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතයට වඩා ඉහළ යාමට බලපාන හේතු කවරේද යන්නයි. නමුත් සිසුන් වැඩි ප්‍රතිශතයක් එම දැනුම හා අවබෝධය ළඟා කරගෙන නො තිබුණි.

- 30 වන ප්‍රශ්නයේ පහසුතාව 22% වැනි පහළ මට්ටමක පැවතීම මගින් පෙන්වන්නේ සිසුන් වැඩි ප්‍රතිශතයක් ප්‍රශ්නයෙන් විමසා ඇති විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික ස්ථායීතාව නිරූපණය කරන නිර්ණායක නිවැරදිව අවබෝධ කොට ගෙන නොමැති බවයි. එම නිසා සාර්ව ආර්ථික ස්ථායීතාවයේ පැතිකඩ හා එහි නිර්ණායක පිළිබඳව අවබෝධය වර්ධනය කළ යුතුය.

- 36 වන ප්‍රශ්නයේ දුෂ්කරතාව 70% වීම මගින් නිරූපණය කරන්නේ අපේක්ෂකයින් වැඩි දෙනෙකුට ප්‍රශ්නයෙන් විමසන ආර්ථික වෘද්ධිය සඳහා භාවිත කරන සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති පිළිබඳ පරිපූර්ණ දැනුමක් නොමැති බවයි. එබැවින් සැපයුම් පාර්ශවීය ප්‍රතිපත්ති හා ඒවා භාවිත කරන විකල්ප ක්‍රම පිළිබඳ දැනුම හා අවබෝධය සිසුන් තුළ ප්‍රගුණ කළ යුතුයි.

- I ප්‍රශ්න පත්‍රයේ දුෂ්කරතාවයෙන් වැඩි ම ප්‍රශ්නය 37 වන ප්‍රශ්නය යි. මේ ප්‍රශ්නයේ දුෂ්කරතාව 96% කි. මෙම ප්‍රශ්නයෙන් විමසන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට ඉහළ ම දායකත්වයක් ලබා දුන් අංශ පිළිබඳව ය. දළ දේශීය නිෂ්පාදනයෙහි සංයුතිය හා එහි වර්ධනයට හෝ පසු බෑමට ලක් වූ අංශ පිළිබඳ දැනුම සිසුන් තුළ ඉතා ම දුර්වල මට්ටමක පැවතුණි. අදාළ මාතෘකාව පිළිබඳ කාලීන තොරතුරු හා දැනුම සිසුන් තුළ යාවත්කාලීන කළ යුතුය.

## 2.2. II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

'අ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

'ආ' කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 05කි.

අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| II පත්‍රය | සඳහා ලකුණු | = | 100 |
| අවසාන ලකුණ = 200 ÷ 2 | | = | 100 |

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

★ **II** පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර අංක **2, 3, 4.1** සහ **4.2** ඇසුරින් ඉදිරිපත් කර ඇත.

**"අ" කොටස**

## 01 ප්‍රශ්නය

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) සමාජයන් සැමවිට ම තෝරා ගැනීමේ ගැටලුවකට මුහුණ දෙන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(ii) ව්‍යවසායකත්වය අනෙක් නිෂ්පාදන සාධකයන්ගෙන් වෙනස්වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)
(iii) 'ප්‍රාග්ධනය' හා 'ආයෝජනය' අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)
(iv) රටක මානව සම්පතෙහි ඵලදායීතාව වැඩිකිරීමට ගතහැකි ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04 යි)
(v) වෙළෙඳපොළ ආර්ථිකයක නිෂ්පාදන තාක්ෂණය තෝරා ගැනීම පිළිබඳ ගැටලුව විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(1) (i)
- අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් සීමා සහිත බව **(ලකුණු 03යි)**
- සම්පත්වල විකල්ප ප්‍රයෝජන පැවතීම **(ලකුණු 01යි)**

(ii)
- ව්‍යවසායකත්වය නිෂ්පාදන සාධක සංයෝග කරමින් නිෂ්පාදන කටයුතු සංවිධානය කරන අතර අනෙකුත් සාධක එවැනි කාර්ය භාරයක් ඉටු නො කරයි.
- ව්‍යවසායකත්වය නිෂ්පාදනය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගනී. අනෙකුත් නිෂ්පාදන සාධක එවැනි තීරණ නො ගනී.
- ව්‍යවසායකත්වය අවදානම් දරන අතර සෙසු සාධක අවදානම් නො දරයි.
- ව්‍යවසායකත්වය නවෝත්පාදනයෙහි සුවිශේෂී වශයෙන් යෙදෙන අතර අනෙකුත් සාධක එසේ නො වේ.
- ව්‍යවසායකත්වය ලබන ආදායම ධන, ඍණ හෝ ශුන්‍ය අගයක් ගනු ලැබිය හැකිය.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04)**

(iii) ප්‍රාග්ධනය නිර්වචනය කිරීමේ දී අඩංගු විය යුතු කරුණු :
- මිනිසා විසින් නිර්මාණය කරන ලද සාධකයකි.
- නිෂ්පාදනයට ආධාරකයක් වේ.
- නැවත නැවත නිෂ්පාදනයට යොදා ගත හැකි වීම
- මූර්ත සංකල්පයකි
- ක්ෂය වීමට භාජනය වීම

**(ඕනෑම කරුණු 2කට ලකුණු 01)**

ආයෝජන නිර්වචනය කිරීමේදී අඩංගු විය යුතු කරුණු :
- ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීමට සම්පත් යෙදවීමේ ක්‍රියාවලිය.
- ආයෝජනය සඳහා සම්පත් ලබා ගන්නේ ඉතුරුම් මාර්ගයෙනි.

**(ඕනෑම කරුණු 2කට ලකුණු 01)**

වෙනස දැක්වෙන කරුණු :
- ප්‍රාග්ධනය තොග විචල්‍යයක් වන අතර ආයෝජනය ප්‍රවාහ විචල්‍යයක් වේ.
- ප්‍රාග්ධනය ක්ෂය වීමට ලක්වන අතර ආයෝජනය මගින් එය ප්‍රතිසම්පාදනය කරගත හැකිය.
- ප්‍රාග්ධනය බිහිවන්නේ ආයෝජනය තුළිනි.

**(ඕනෑම කරුණු 2කට ලකුණු 02)**

(iv) - අධ්‍යාපනය හා පුහුණුව ලබා දීම
- සෞඛ්‍ය හා පෝෂණ තත්වය දියුණු කිරීම
- නව තාක්ෂණ හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය
- ආකල්ප සංවර්ධනය කිරීම
- භෞතික ප්‍රාග්ධනය ඉහළ නැංවීම

**(එකකට එක බැගින් ලකුණු 04)**

(v) - වෙළෙඳපොළ ආර්ථිකයක ශිල්පීය ක්‍රමය තෝරා ගැනීම (කෙසේ නිෂ්පාදනය කරන්නේද යන ගැටලුව) මිල යාන්ත්‍රණයේ මඟ පෙන්වීම මත සිදුවේ
- නිෂ්පාදන සාධකවල සාපේක්ෂ මිල මත ශ්‍රම සූක්ෂම හෝ ප්‍රාග්ධන සූක්ෂම ක්‍රමය තෝරා ගනී
- ස්වාර්ථය (ලාභය) පිණිස තාක්ෂණයේ තෝරා ගැනීම සිදුවේ.
- අවම පිරිවැය සහිත ශිල්ප ක්‍රමය තෝරා ගනී.

**(එකකට එක බැගින් ලකුණු 04)**

**01 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




01 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 99.13%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 21%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 34%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 13%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 05ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 34%කි. එමෙන්ම (i) කොටස පහසු ම කොටස වී ඇති අතර එහි පහසුතාව 72%කි.

- (i) වන කොටසෙහි පහසුතාව 72% කි. (i) වන කොටස මගින් විමසන්නේ තෝරා ගැනීමේ ගැටලුව හා ඊට බලපාන හේතු පිළිබඳවයි. සිසුන් වැඩි පිරිසක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණ ද, අසාර්ථක පිළිතුරු පැවතීමට හේතු වී ඇත්තේ තෝරා ගැනීමේ ගැටලුවට බලපාන අසීමිත වුවමනාවන්ට සාපේක්ෂව සම්පත් සීමිත වීම හා සම්පත්වල විකල්ප ප්‍රයෝජන පැවතීම යන කරුණු පිළිබඳ දැනුම නොමැති වීමයි. උක්ත කරුණු අවධාරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතුය.

- (ii) වන කොටසේ පහසුතාව 54% කි. ව්‍යවසායකත්වය අනෙක් නිෂ්පාදන සාධක හා සන්සන්දනය කරමින් කරුණු ඉදිරිපත් කිරීමට නො හැකි වූ නිසා සිසුන් වැඩි පිරිසකට මුළු ලකුණු ලබා ගැනීමට නොහැකි විය. වෙනස්කම් 4ක් සඳහා ලකුණු 4 ලබා දී තිබූ අතර සිසුන් වෙනස්කම් 2ක් හෝ 3ක් පමණක් ඉදිරිපත් කර තිබුණි. සෙසු සාධක සමග සන්සන්දනය කරමින් සම්පූර්ණ පිළිතුරු ලිවීමට සිසු අවධානය යොමු කළ යුතුය.

- (iii) වන කොටසේ පහසුතාව 34% කි. මෙම ප්‍රශ්නය මගින් විමසන්නේ ප්‍රාග්ධනය හා ආයෝජනය අතර වෙනස පිළිබඳවයි. සිසුන් වැඩි පිරිසකට සාර්ථකව පිළිතුරු සැපයීමට නො හැකි වී ඇත්තේ ප්‍රාග්ධනය නිවැරදිව නිර්වචනය කොට ඊට ආවේනික ලක්ෂණ හඳුනාගත හැකි වුවත්, ආයෝජනයේ සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීමට නොහැකි වීම නිසාය. එබැවින් ප්‍රාග්ධනයේ ලක්ෂණ හා ආයෝජනයේ ලක්ෂණ සංසන්දනය කිරීමට සිසුන් තුළ කුසලතා ප්‍රගුණ කළ යුතුය. .

- (iv) වන කොටසේ පහසුතාවය 54% කි. රටක මානව සම්පතෙහි ඵලදායීතාවය වැඩි කිරීමට හැකි ක්‍රියා මාර්ග පිළිබඳව සිසුන්ගෙන් අඩකට පමණ මනා අවබෝධයක් නො තිබුණ බව පෙනුනි. මානව සම්පතෙහි ඵලදායීතාවය වැඩි කිරීමට අදාළ සාධක පිළිබඳව දැනුම දියුණු කළ යුතුය.

- (v) වන කොටසේ පහසුතාව 48% කි. වෙළෙඳපොළ ආර්ථිකයක් නිෂ්පාදන තාක්ෂණය තෝරා ගැනීමේ ගැටලුව විසඳා ගන්නා ආකාරය පිළිබඳව සිසුන් තුළ වැඩි අවබෝධයක් නො තිබුන බව පෙනී යයි. තාක්ෂණය තෝරා ගැනීමේ ගැටලුව යනු කෙසේ නිෂ්පාදනය කරනවාද යන ගැටලුව බවත්, වෙළෙඳපොළ ආර්ථිකයක් මේ ගැටලුව සුවිශේෂීව විසඳා ගන්නා ආකාරය පිළිබඳව සිසුන් තුළ දැනුම සංවර්ධනය කළ යුතුය.

## 02 ප්‍රශ්නය

2. (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යනු කුමක් දැ'යි රූපසටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) නිෂ්පාදන සම්පත් භාවිතයේ දී වැඩෙන ආවස්ථික පිරිවැයක් ඇතිවන්නේ කවර හේතු නිසා දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන සංසිද්ධීන් නිෂ්පාදන හැකියා මායිම් රූපසටහන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ) රටකින් බැහැර ව සිටි වෘත්තිකයන් සැලකිය යුතු පිරිසක් නැවත පැමිණීම (ලකුණු 02 යි)

(ආ) ස්වාභාවික ආපදාවක් හේතුවෙන් රටක ප්‍රාග්ධන සම්පත් විනාශ වීම (ලකුණු 02 යි)

(ඉ) මාර්ග පද්ධතියේ පුළුල්වීමක් හේතුකොට ගෙන මෙතෙක් භාවිත නොවූ ග්‍රාමීය සම්පත් නිෂ්පාදනයට යොමුවීම (ලකුණු 02 යි)

(ඊ) ඇඟලුම් කර්මාන්තයට සාපේක්ෂ ව සංචාරක කර්මාන්තය වැඩි වේගයකින් ප්‍රසාරණය වීම (ලකුණු 02 යි)

(iv) ආර්ථිකයක දෙන ලද තාක්ෂණය යටතේ පවතින සම්පත් පූර්ණ වශයෙන් සේවා නියුක්ත කළ පසු නිෂ්පාදනය කළ හැකි X සහ Y භාණ්ඩ සංයෝග පහත වගුවේ දැක්වේ.

| නිෂ්පාදන සංයෝග | X භාණ්ඩයේ ඒකක | Y භාණ්ඩයේ ඒකක |
|---|---|---|
| A | 0 | 150 |
| B | 20 | 140 |
| C | 40 | 125 |
| D | 60 | 105 |
| E | 80 | 70 |
| F | 100 | 0 |

(අ) මෙම ආර්ථිකයේ නිෂ්පාදන සංයෝග (A-B, B-C, C-D, D-E සහ E-F) අතර ආවස්ථික පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සංඛ්‍යා සටහනට අනුව, X භාණ්ඩයෙන් ඒකක 40 ක සහ Y භාණ්ඩයෙන් ඒකක 60 ක සංයෝගයක් නිපදවන අවස්ථාවේ සිට X භාණ්ඩයෙන් ඒකක 60 ක සහ Y භාණ්ඩයෙන් ඒකක 80 ක සංයෝගයක් නිපදවන අවස්ථාව දක්වා මාරුවීමේ දී ආවස්ථික පිරිවැයක් පවතින්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 02 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

2 (i) භාණ්ඩ දෙවර්ගයක් නිපදවන සරල ආර්ථිකයක නිශ්චිත අවස්ථාවක පවත්නා තාක්ෂණය යටතේ සියලු සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව භාවිත කර නිපදවිය හැකි විකල්ප නිමැවුම් සංයෝග දැක්වෙන මායිම් රේඛාව නිෂ්පාදන හැකියා මායිමයි.




(ලකුණු 02)

නිෂ්පාදන හැකියා මායිම් රූප සටහනක ඇඳ, එහි භාණ්ඩ වර්ග දෙක නම් කොට තිබීම සහ වක්‍රය " නිෂ්පාදන හැකියා මායිම " ලෙස නම් කර තිබීම අවශ්‍ය වේ. නැතහොත් වක්‍රය ඇතුළත ශක්‍ය ප්‍රදේශය ලෙස නම් කර තිබිය යුතුය. (වක්‍රයේ හැඩය අදාළ නො වේ.)

(ලකුණු 02)

(ii)
- සම්පත් සමජාතීය නො වීම (ලකුණු 02යි)
- එක් කර්මාන්තයකට කාර්යක්ෂම වන සම්පත් අනෙක් කර්මාන්තයට ද ඒ ආකාරයෙන් ම කාර්යක්ෂම නො වීම
- භාණ්ඩ වර්ග දෙක නිපදවීම සඳහා යොදා ගැනෙන තාක්ෂණය එකිනෙකට වෙනස් වීම

(එක් කරුණකට ලකුණු 02බැගිනි)

(iii) (අ) මෙම ආර්ථිකයේ සම්පත් සම්භාරය වැඩිවන බැවින් නිෂ්පාදන හැකියාව වැඩි වේ. මෙය නි.හැ.මා. වක්‍රය දකුණට විතැන් වීමකින් දැක්විය හැකි ය.




මෙම ආර්ථිකයේ සම්පත් සම්භාරය වැඩිවන බැවින් නිෂ්පාදන හැකියාව වැඩි වේ. මෙය නි.හැ.මා. වක්‍රය දකුණට විතැන් වීමකින් දැක්විය හැකිය.

**(රූප සටහනට ලකුණු 1යි. පැහැදිලි කිරීමට ලකුණු 01)**

(ආ)




රටක ප්‍රාග්ධන සම්පත් විනාශ වීම නිසා නිෂ්පාදන හැකියාව අඩුවේ. මෙය නි.හැ.මා වක්‍රය වමට විතැන් වීමකින් දැක්විය හැකිය.

**(රූප සටහනට ලකුණු 01යි. පැහැදිලි කිරීමට ලකුණු 01)**

(ඉ)




මෙතෙක් භාවිතයට නො ගත් සම්පත් භාවිතයට ගැනීම නිසා නි.හැ.මායිමෙන් ඇතුළත පිහිටි ලක්ෂ්‍යයක සිට මායිම දෙසට ගමන් කිරීමක් සිදුවේ.

**(රූප සටහනට ලකුණු 01යි. පැහැදිලි කිරීමට ලකුණු 01)**

(ඊ)




ඇඟළුම් කර්මාන්තයේ නිෂ්පාදනයට සාපේක්ෂව සංචාරක කර්මාන්තයේ නිෂ්පාදනය ඉහළ යයි. මෙය පවතින නි. හැ. මා වක්‍රය ඇඟළුම් කර්මාන්තය දක්වන අක්ෂයට සාපේක්ෂව සංචාරක කර්මාන්තය දක්වන අක්ෂයෙන් වැඩි වශයෙන් දකුණට විතැන් වීමකින් පිළිබිඹු කරයි.

**(රූප සටහනට ලකුණු 01යි. පැහැදිලි කිරීමට ලකුණු 01)**

(iv) (අ) දෙන ලද ලක්ෂ්‍ය අතර ආවස්ථික පිරිවැය පහත සේ දැක්විය හැකිය.

Y භාණ්ඩයේ ඒකක

A සිට B දක්වා $\frac{10}{20}$ = 0.5

B සිට C දක්වා $\frac{15}{20}$ = 0.75

C සිට D දක්වා $\frac{20}{20}$ = 1

D සිට E දක්වා $\frac{35}{20}$ = 1.75

E සිට F දක්වා $\frac{70}{20}$ = 3.5

**(ලකුණු 02යි)**

(ආ) - ආවස්ථික පිරිවැයක් නැත
- සේවා වියුක්ත සම්පත් සේවා නියුක්ත කරවීමක් වන බැවින් ආවස්ථික පිරිවැයක් නොමැත
- මෙහි දී නිෂ්පාදන හැකියා මායිම ඇතුළත ලක්ෂ්‍යයක සිට නිෂ්පාදන හැකියා මායිම දෙසට ගමන් කිරීමක් බැවින් ආවස්ථික පිරිවැයක් නොමැත.

(ලකුණු 01)

**02 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




02 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 78.89%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 22%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 31%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 18%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නය කොටස් 04 කින් සමන්විත වන අතර ඉන් පහසුතාව වැඩි ම කොටස ii වේ. එහි පහසුතාව 64%කි.

- (i) කොටසෙහි පහසුතාව 60% කි. අදාළ ප්‍රශ්නය මගින් විමසනු ලබන්නේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කිරීමයි. අපේක්ෂකයින් වැඩි දෙනෙකුට සාර්ථක පිළිතුරු සැපයීමට හැකිව තිබුණ ද, අපේක්ෂකයින් පිරිසක් ඊට අසමත්ව ඇත්තේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය නිවැරදිව අර්ථ දක්වා, නිවැරදිව අක්ෂ නම් කොට රූප සටහන නිර්මාණය කිරීමට අපොහොසත් වූ නිසාය. එම ගැටලු නිරාකරණය වන පරිදි සිසුන්ගේ දැනුම හා භාවිත කුසලතා වැඩි දියුණු කළ යුතුය.

- (ii) වන කොටසෙහි පහසුතාව 64% කි. එය මෙම ප්‍රශ්නයේ පහසුතාවයෙන් වැඩි ම කොටසයි. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පදනම් කරගෙන වැඩිවන ආවස්ථික පිරිවැයට බලපාන හේතු නම් කිරීමට බොහෝ සිසුන් සමත් වී ඇත. නමුත් එම කරුණු නම් කිරීමේදී එක් එක් සාධකය සුවිශේෂ ලෙස නම් කිරීම එතරම් සතුටුදායක ලෙස කර නැත. විශේෂයෙන් ආවස්ථික පිරිවැය වැඩි වීමට බලපාන, එක් කර්මාන්තයකට වඩාත් කාර්යක්ෂම සම්පත් අනෙක් කර්මාන්තයට ඒ ආකාරයෙන් ම කාර්යක්ෂම නො වීම යන සාධකය සිසුන් විසින් හරියාකාරව අවබෝධ කොට ගෙන නොමැති බව පෙනුණි. එම නිසා එම විෂය කරුණු පිළිබඳ සිසුන්ගේ දැනුම සංවර්ධනය කළ යුතුවේ.

- (iii) වන කොටස, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙහි ප්‍රායෝගික භාවිතයන් කෙරෙහි අවධානය යොමු වී ඇති අතර එය කොටස් 04 කින් යුක්ත විය. එක් එක් කොටසෙහි පහසුතාවන්හි වෙනස්කම් පැවතුණි.
  - (අ) අනු කොටසෙහි පහසුතාව 54% කි. ශ්‍රමිකයන්ගේ නැවත පැමිණීම මගින් රටෙහි සම්පත් සම්භාරය ඉහළ යන බව අවබෝධ කර දිය යුතුය. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය විතැන්වන දිශාව නිවැරදිව දක්වා නො තිබීම වැනි කරුණු මත ලකුණු ලබා ගැනීමේදී ඌණතාවක් පෙන්වා තිබුණි.
  - (ආ) අනු කොටසෙහි පහසුතාව 60% කි. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ ප්‍රාග්ධන සම්පත් විනාශ වීමක් නිෂ්පාදන හැකියා මායිමට බලපාන්නේ කෙසේද යන්නයි. සිසුන් සැලකිය යුතු ප්‍රමාණයක් අදාළ දැනුම ප්‍රගුණ කොට ඇතත් සුළු පිරිසක් අසාර්ථක වී ඇත්තේ නිෂ්පාදන හැකියා මායිමේ ප්‍රායෝගික භාවිත පිළිබඳ දැනුම නොමැති වීම නිසයි.

(ඉ) අනු කොටසෙහි පහසුතාව 45% කි. සම්පත් භාවිතය ඉහළ යාම නිෂ්පාදන හැකියා මායිම මගින් දක්වන ආකාරය බහුතර සිසුන් පිරිසක් අවබෝධ කරගෙන නො තිබූ බව පෙනී යයි.

(ඊ) මෙම කොටසෙහි පහසුතාව 37% කි. (iii) වන කොටසෙහි පහසුතාව අඩු ම කොටස මෙය යි. නිෂ්පාදන හැකියා වක්‍රය විතැන් කිරීමේ දි සාපේක්ෂව වැඩිපුර විතැන් කළ යුතු ආකාරය නිවැරදිව හඳුනා ගැනීම කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කළ යුතුය.

නිෂ්පාදන හැකියා මායිමේ ප්‍රායෝගික භාවිතයන් තහවුරු වන පරිදි විවිධත්වයෙන් යුතු අභ්‍යාස කිරීමට යොමු කිරීමෙන් සිසුන්ගේ කුසලතා දියුණු කළ හැකි වනු ඇත.

⋆ (iv) වන කොටස, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මගින් වැඩිවන ආවස්ථික පිරිවැය සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කෙරෙහි අවධානය යොමු කර තිබුණි. මෙම කොටස උප කොටස් 2 කින් යුක්ත විය.

(අ) අනු කොටසෙහි පහසුතාව 58% කි. දෙන ලද දත්ත භාවිත කර ආන්තික ආවස්ථික පිරිවැය ගණනය කර ගැනීම සඳහා සිසුන් තුළ කුසලතාව දියුණු කළ යුතුය.

(ආ) අනු කොටසෙහි පහසුතාව 42% කි. සාපේක්ෂව දුෂ්කරතාව වැඩි කොටසක් විය. දෙන ලද දත්ත අනුව පවතින නිෂ්පාදන සංයෝගය ඌණ සේවා නියුක්ත එකක් බව හඳුනා ගැනීම පිළිබඳව සිසුන් තුළ තිබූ අවබෝධය ඉතා අඩු මට්ටමක පැවති අතර සේවා වියුක්තව පවතින නිෂ්පාදන සම්පත් සේවා නියුක්ත වන අවස්ථාවක ආවස්ථික පිරිවැයකින් තොරව නිෂ්පාදනය වැඩි කර ගත හැකි බව අවබෝධ කර දිය යුතුය.

## 03 ප්‍රශ්නය

3. (i) ජංගම දුරකථන සඳහා වෙළෙඳපොළ ඉල්ලුම තීරණය කරන සාධක කවරේ ද? (ලකුණු 05 යි)

(ii) භාණ්ඩයක මිල හා සැපයුම් ප්‍රමාණය අතර පවතින අනුලෝම සම්බන්ධතාව රඳාපවතින ප්‍රධාන කරුණු මොනවා ද? (ලකුණු 05 යි)

(iii) භාණ්ඩයක සැපයුම කෙරෙහි බලපාන 'අන් භාණ්ඩවල මිල' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05 යි)

(iv) "නිදහස් වෙළෙඳපොළක සමතුලිතයක් ඇතිවීම සඳහා උපරිම ඉල්ලුම් ප්‍රමාණයට වඩා අවම සැපයුම් ප්‍රමාණය අඩුවිය යුතු ය" මෙම ප්‍රකාශය රූපසටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(3) (i)
- ගැණුම්කරුවන් සංඛ්‍යාව
- ජංගම දුරකතන මිල
- ස්ථාවර දුරකථන මිල / අනෙකුත් දුරකථන මිල (ආදේශන භාණ්ඩ මිල)
- සිම් කාඩ් මිල/ දුරකථන ගාස්තු (අනුපූරක භාණ්ඩ මිල)
- පාරිභෝගික ආදායම
- පාරිභෝගික රුචිය
- අනාගත මිල අපේක්ෂා

(ගැණුම්කරුවන් සංඛ්‍යාව ඇතුළත්ව තවත් කරුණු 4කට ලකුණු 05)

(ii) - සැපයුම්කරුවන්ගේ ලාභය
- ආන්තික පිරිවැය / ආන්තික ආවස්ථික පිරිවැය

**(එකකට ලකුණු 03**
**දෙකම ලියා ඇත්නම් ලකුණු 05)**

(iii) - සමාන යෙදවුම් වලින් නිපදවිය හැකි විවිධ භාණ්ඩ වල මිල ගණන්
- එකම තාක්ෂණය යොදා ගෙන නිපදවිය හැකි වෙනත් භාණ්ඩ මිල ගණන්

**(එකකට ලකුණු 03 යි. කරුණු දෙකම ඇතොත් ලකුණු 05)**

(iv) -




**(ලකුණු 02යි)**

Pe - සමතුලිත මිල Qe - සමතුලිත ප්‍රමාණය

(ඉහත රූප සටහනේ දැක්වෙන පරිදි අවම සැපයුම් ප්‍රමාණය හා උපරිම ඉල්ලුම් ප්‍රමාණය යන දෙක ම සටහන් කර තිබීම අවශ්‍ය වේ. $S_1$ වක්‍රය ඇඳ තිබීම අනිවාර්ය නො වේ.)

**(ලකුණු 02යි)**

යම් භාණ්ඩයක උපරිම ඉල්ලුම් ප්‍රමාණයට වඩා අවම සැපයුම් ප්‍රමාණය වැඩි වූ විට වෙළෙඳපොළ සමතුලිතයක් ඇති නො වේ. සමතුලිතයක් ඇතිවන්නේ උපරිම ඉල්ලුම් ප්‍රමාණයට වඩා අවම සැපයුම් ප්‍රමාණය අඩු වූ විටකදී ය.

**(විස්තරයට ලකුණු 02යි)**

**03 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




03 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 44.87%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 50%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 12%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iii) වී ඇති අතර, එහි පහසුතාව 9%කි. පහසුතාව වැඩි ම කොටස (i) වී ඇති අතර, එහි පහසුතාව 65%කි.

- 3 වන ප්‍රශ්නයේ (i) කොටසෙහි පහසුතාව 65% කි. ඉල්ලුම් තීරක පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නයකි. එහෙත් සිසුන් සැලකිය යුතු පිරිසක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත්ව ඇත්තේ ඉල්ලුම් තීරක පිළිබඳ සාමාන්‍ය දැනුම නොමැති වීමෙනි. එම දැනුම තහවුරු කෙරෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

- සැපයුම් නීතියට බලපාන සාධක මෙමගින් අසා තිබූ අතර එහි පහසුතාව 21% කි. සැපයුම් නීතියට බලපාන සාධක පිළිබඳව සිසුන් ගේ දැනුම මඳ බව පෙනී යයි. සැපයුම් නීතියට හේතු ලෙස වැඩි වන ආවස්ථික පිරිවැය නීතිය යන්න පමණක් බොහෝ සිසුන් ලියා තිබුණ ද, සැපයුම් නීතියට බලපාන සාධකයක් ලෙස සැපයුම් කරුට ලැබෙන ලාභ වෙනස්වීම සඳහන් නොවීම පිළිතුරු අසාර්ථක වීමට හේතු විය. එබැවින් සැපයුම් නීතියට හේතු වන සියලු සාධක නිවැරදිව දැක්වීමට සිසුන් තුළ දැනුම වර්ධනය කළ යුතුය.

- (iii) කොටසෙහි පහසුතාව 9% කි. සැපයුමට බලපාන අන් භාණ්ඩ මිල (සම්බන්ධිත භාණ්ඩවල මිල) යන්න පිළිබඳව සිසුන්ගේ දැනුම ඉතා අඩු මට්ටමක පැවතුණි. සැපයුමේ දී අන් භාණ්ඩ සහ ඉල්ලුමේ දී අන් භාණ්ඩ යනුවෙන් අදහස් කරන්නේ මොනවා ද යන්න වෙන් වෙන් වශයෙන් අර්ථ දැක්වීමට සිසුන් තුළ දැනුම වර්ධනය කළ යුතුය.

- (iv) කොටසෙහි පහසුතාව 21% කි. මෙම ප්‍රශ්නය මගින් විමසීමට ලක් කරන්නේ වෙළෙඳපොළ සමතුලිතය හා එය තීරණය වීමේ දී අවම සැපයුම් ප්‍රමාණය සහ උපරිම ඉල්ලුම් ප්‍රමාණය පිහිටිය යුතු ස්ථානයන් පිළිබඳවය. අදාළ විෂය කරුණු පිළිබඳ සිසුන් තුළ ප්‍රමාණවත් දැනුමක් නොතිබූ බැවින් වැඩි දෙනෙකු නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. එබැවින් වෙළෙඳපොළ සමතුලිතය තීරණය වීමේදී ඉටුවිය යුතු අවශ්‍යතා ප්‍රස්තාර, මගින් අවධාරණය කළ යුතුය.

## 04 ප්‍රශ්නය

4. කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 150 - 5P$ (ඉල්ලුම් සමීකරණය)

$Qs = 75 + 10P$ (සැපයුම් සමීකරණය)

ඉහත තොරතුරු ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.

(i) වෙළෙඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය (ලකුණු 02 යි)

(ii) වෙළෙඳපොළ සමතුලිතයේ දී පවතින පාරිභෝගික අතිරික්තයේ වටිනාකම (ලකුණු 03 යි)

(iii) සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතා සහ සැපයුම් නම්‍යතා සංගුණකවල වටිනාකම (ලකුණු 04 යි)

(iv) රජය විසින් මෙම භාණ්ඩය මත රු. 1.50 ක ඒකක බද්දක් පැන වූ විට,

(අ) බද්දෙන් පසු නව සමතුලිත මිල සහ ප්‍රමාණය (ලකුණු 02 යි)

(ආ) රජයේ බදු ආදායම (ලකුණු 03 යි)

(ඉ) බද්ද හේතුවෙන් පාරිභෝගික අතිරික්තයට වන බලපෑම (ලකුණු 03 යි)

(ඊ) බද්ද නිසා සමාජයට අහිමි ව යන සුභසාධනයේ වටිනාකම (ලකුණු 03 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

04. (i) $Qd = 150 - 5P$ (ඉල්ලුම් සමීකරණය)

$Qs = 75 + 10P$ (ඉල්ලුම් සමීකරණය)

වෙළෙඳපොළ සමතුලිතයේ දී, $Qd = Qs$

$$150 - 5P = 75 + 10P$$
$$150 - 75 = 10P + 5P$$
$$15P = 75$$
$$P = \frac{75}{15}$$
$$P = \underline{\underline{5}}$$ (සමතුලිත මිල රුපියල් 5 ක් වේ)

(ලකුණු **01යි**)

සමතුලිත ප්‍රමාණය

| | |
|---|---|
| $Qd = 150 - 5P$ | $Qs = 75 - 10P$ |
| $Qd = 150 - 5 \times 5$ | $Qs = 75 + 10 \times 5$ |
| $Qd = 150 - 25$ | $Qs = 75 + 50$ |
| $Qd = \underline{\underline{125}}$ | $Qs = \underline{\underline{125}}$ |

(ලකුණු **01යි**)

සමතුලිත ප්‍රමාණය ඒකක 125 කි.

(ii) පාරිභෝගික අතිරික්තය $= \frac{(\text{උපරිම ඉල්ලුම් මිල - සමතුලිත මිල}) \times \text{සමතුලිත ප්‍රමාණය}}{2}$

(ලකුණු **01යි**)

$$= \frac{(30 - 5) \times 125}{2}$$

(ලකුණු **01යි**)

$$= \frac{25 \times 125}{2}$$

$$= \underline{\underline{1562.50}}$$

(ලකුණු **01යි**)

(iii) ඉල්ලුම් නම්‍යතා සංගුණකය $= b \times \frac{P}{Qd}$

$P_{ED} = 5 \times \frac{5}{125}$ **(ලකුණු 01යි)**

$P_{ED} = \underline{\underline{0.2}}$ **(ලකුණු 01යි)**

ඉල්ලුම් නම්‍යතා සංගුණකය $= b \times \frac{P}{Qs}$

ඉල්ලුම් නම්‍යතා සංගුණකය $= b \times \frac{P}{Qs}$

$P = \frac{10 \times 5}{125}$ **(ලකුණු 01යි)**

$P_{ED} = \underline{\underline{0.4}}$ **(ලකුණු 01යි)**

(iii) (අ)

බද්දෙන් පසු සැපයුම් සමීකරණය

$QS_1 = 75 + 10\ (P - 1.50)$

$QS_1 = 75 + 10\ P - 1.50$

$QS_1 = 60 + 10\ P$

සමතුලිත මිලේදී, $Qd = Qs$

$150 - 5\ P = 60 + 10\ P$

$150 - 60 = 10\ P + 5\ P$

$15\ P = 90$

$P = \frac{90}{15}$

$P = \underline{\underline{6}}$ (බද්දෙන් පසු සමතුලිත මිල)

බද්දෙන් පසු සමතුලිත ප්‍රමාණය

$Qd = 150 - 5\ P$

$Qd = 150 - 5 \times 6$

$Qd = 150 - 30$

$Qd = \underline{\underline{120}}$

**(සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය නිවැරදිව ගණනය කොට ඇත්නම් ලකුණු 1 බැගින් ලකුණු 02)**

(ආ) රජයේ බදු ආදායම = ඒකක බද්ද × නව සමතුලිත ප්‍රමාණය

$= 1.50 \times 120$ **(ලකුණු 01යි)**

$= \underline{\underline{180}}$ **(ලකුණු 01යි)**

(ඉ) රජයේ බදු ආදායම = බද්දට පෙර පාරිභෝගික අතිරික්තය - බද්දට පසු පාරිභෝගික අතිරික්තය **(ලකුණු 01යි)**

$= (1562.50 - 1440)$ **(ලකුණු 01යි)**

= 122.50 කින් අඩු වේ. **(ලකුණු 01යි)**

විකල්ප පිළිතුර

$$= \frac{(125 + 120) \times 1}{2}$$ (ලකුණු 02යි)

$= 122.50$ කින් අඩු වේ. (ලකුණු 01යි)

(ඊ) බද්ද නිසා සමාජයට අහිමිවන ශුභසාධනය $= \frac{\text{ඒකක බද්ද} \times \text{බද්දෙන් පසු අලෙවි ප්‍රමාණයේ වෙනස}}{2}$ (ලකුණු 02යි)

$$= \frac{1.50 \times (125 - 120)}{2}$$

= රු.3.75 (ලකුණු 02යි)

(ප්‍රස්තාර භාවිතයෙන් හෝ වෙනත් විකල්ප ක්‍රම මඟින් පිළිතුරු නිවැරදිව ගණනය කර ඇත්නම් ලකුණු ලබා දිය හැකිය.)

**04 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




04 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 82.09%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 26%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 21%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 20%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 33%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් iv ක් ඇත. පහසුතාව අඩු ම කොටස (iv)(ඊ) වී ඇති අතර, එහි පහසුතාව 36%කි. පහසුතාව වැඩි ම කොටස (i) වී ඇති අතර, එහි පහසුතාව 93%කි.

★ I කොටසෙහි පහසුතාව 93%කි. සිසුන් ඉල්ලුම් හා සැපයුම් සමීකරණ මගින් සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කිරීම සාර්ථක ව සිදු කර තිබුණි.

★ II වෙළෙඳපොළ සමතුලිතයේ දී පරිභෝගික අතිරික්තයේ වටිනාකම අසා තිබූ මෙම ප්‍රශ්නයේ පහසුතාව 72%කි. සමීකරණ මගින් විසඳිය යුතු වුවත් ප්‍රස්තාර මගින් පාරිභෝගික අතිරික්තය සෙවීමට බොහෝ සිසුන් පෙළඹී තිබුණි. එය ලකුණු අඩු වීමට ප්‍රධාන ම හේතුව විය. එබැවින් ගැටලුව මගින් විමසා ඇති ආකාරයට ම පිළිතුර සැපයීමට සිසුන් පුහුණු කළ යුතුය.

★ III කොටසෙහි පහසුතාව 67%කි. නම්‍යතාව ගණනය කිරීමේ දී ඉල්ලුම් වක්‍රයේ බෑවුමේ පරස්පරය ගෙන නම්‍යතා සූත්‍රයට ආදේශ කිරීමට වැඩි දෙනෙකුට අවබෝධයක් නො තිබුණි. ප්‍රස්තාරය තුළින් ගත් තොරතුරු මත නම්‍යතාව ගණනය කිරීමක් බොහෝ විට දැකිය හැකි විය. මේ නිසා නම්‍යතාව ගණනය කරන විට සමීකරණය ඇසුරෙන් ද ගණනය කිරීමට සිසුන් දැනුවත් කළ යුතු ය.

★ (iv) කොටසින් විමසා තිබුණේ භාණ්ඩ ඒකකයකට නිශ්චිත බද්දක් පැන වූ විට වෙළෙඳපොළ සමතුලිතයට, රජයේ බදු ආදායමට, පාරිභෝගික අතිරික්තයට, හා සමාජ ශුභසාධනය අහිමි වීමට සිදු වූ බලපෑම පිළිබඳ ව ය.

(අ) කොටස මගින් නිශ්චිතව ම විමසා තිබුණේ බද්දෙන් පසු සමතුලිත මිලට හා ප්‍රමාණයට ඇති වූ බලපෑම පිළිබඳව යි. එම ප්‍රශ්නයේ පහසුතාව 69%ක් වීම මගින් පෙන්වන්නේ අපේක්ෂකයින් සැලකිය යුතු ප්‍රතිශතයක් උක්ත ගැටලුව පිළිබඳ සාධනීය මට්ටමක පසුවන බවයි. සමීකරණ හා ප්‍රස්තාර මගින් ඒකක බද්ද සමතුලිතය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ සිසුන්ගේ දැනුම තව දුරටත් ප්‍රගුණ කළ යුතු ය.

(ආ) රජයේ බදු ආදායම සෙවිය යුතු මෙම ප්‍රශ්නයේ පහසුතාව 56%කි. පිළිතුර ලබාගත් ආකාරය නො දක්වා හුදෙක් පිළිතුර පමණක් දීමට, සිසුන් පෙළඹීම නිසා එක් ලකුණක් අහිමි වීම දැකිය හැකි විය. මේ නිසා සමීකරණය ලියා එයට දත්ත ආදේශ කිරීමෙන් පසු ගණනය කොට, පිළිතුරු ලබා දීම වැදගත් බව, සිසුන්ගේ අවධානයට ලක් කළ යුතු ය.

(ඉ) කොටස ද ඉහත ප්‍රශ්නය හා සම්බන්ධ වන අතර, එහි පහසුතාව 49%කි. පාරිභෝගික අතිරික්තයට වන බලපෑම පැහැදිලි ව පෙන්වීමට සිසුන් අසමත් විය. පෙර අතිරික්තය පමණක් නිවැරදි ව ගණනය කළ සිසුන් බහුල ව සිටි අතර, පසු අතිරික්තය නිවැරදි නො වීය. ඒ අනුව පෙර අතිරික්තය හා පසු අතිරික්තයේ වෙනස නිවැරදි ව ගණනය කිරීමට සිසුන්ගේ දැනුම වර්ධනය කළ යුතු ය.

(ඊ) මෙම ප්‍රශ්නයේ පහසුතාව 36%කි. හතරවන ප්‍රශ්නය තුළ සිසුන්ගේ පහසුතාව අඩු ම අනු කොටස මෙය වේ. ආර්ථික අතිරික්තයෙන්, රජයේ ආදායම බැහැර කොට අහිමි වන සමාජ ශුභසාධනය ගණනය කිරීමට උත්සාහ කිරීමෙන් සිසුන් වැඩි දෙනෙකු නිවැරදි පිළිතුර ලබා දීමට අසමත් වීමක් දැකිය හැකි ය. නිශ්චිතව ම අහිමි වන සමාජ ශුභසාධනය සෙවීමට සිසුන් යොමු කිරීම වඩා වැදගත් වේ.

## 05 ප්‍රශ්නය

5. පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක දෙන ලද වර්ෂයක් සඳහා අදාළ තොරතුරු ය. (සියලු ම අගයන් රු. මිලියන වලිනි.)

| | |
|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම | 800 |
| රජයේ මිල දී ගැනීම් | 150 |
| ආනයන | 60 |
| දේශීය පෞද්ගලික ආයෝජන | 200 |
| විදේශීය සාධක ඉපයීම් | 40 |
| තොග වෙනස්වීම් | 50 |
| ක්ෂයවීම් | 40 |
| අපනයන | 80 |
| විදේශයන්ට කළ සාධක ගෙවීම් | 60 |
| අමුද්‍රව්‍ය මිල දී ගැනීම් | 20 |
| කොටස් හා බැඳුම්කර මිල දී ගැනීම් | 15 |

(i) මෙම ආර්ථිකයේ,
  (අ) සමාහාර ඉල්ලුම් සමීකරණය ගොඩනගන්න. (ලකුණු 03 යි)
  (ආ) දළ දේශීය වියදම ගණනය කරන්න. (ලකුණු 03 යි)
  (ඉ) දළ ජාතික වියදම ගණනය කරන්න. (ලකුණු 03 යි)
  (ඊ) ශුද්ධ ජාතික වියදම ගණනය කරන්න. (ලකුණු 03 යි)
(ii) සරල ආර්ථිකයක සාර්ව ආර්ථික සමතුලිතය රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iii) ආයෝජන ගුණකය ජාතික ආදායම නිර්ණය සඳහා කොපමණ බලපෑමක් කරන්නේ ද? උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(5) (i) (අ) සමාහාර ඉල්ලුම = පෞද්ගලික පරිභෝජනය + දේශීය පෞද්ගලික ආයෝජනය + රජයේ මිලදී ගැනීම් + ශුද්ධ අපනයන

AD = C + I + G + (X - M) **(ලකුණු 03)**

හෝ

| | |
|---|---|
| සමාහාර ඉල්ලුම | = පෞද්ගලික පරිභෝජනය + (දේ. පෞද්. ආ + ක්‍ෂය වීම්) + රජයේ මිලදී ගැනීම් + ශුද්ධ අපනයන |
| AD | = C + (I + D) + G + (X -M) |

(ආ) ද.දේ. වි. = C + I + G (ලකුණු 01)
= 800 + 200 + 150 (ලකුණු 01)
= 1150 (ලකුණු 01)

(සූත්‍රය ලිවීම අනිවාර්ය නො වේ)

හෝ

| | | |
|---|---|---|
| ද.දේ. වි. | = C + I + G | (ලකුණු 01) |
| | = 800 + (200 + 40) 150 | (ලකුණු 01) |
| | = 1190 | (ලකුණු 01) |

(සූත්‍රය ලිවීම අනිවාර්ය නො වේ)

(i) GNE = GED + (X - M) + (NFIA)

ජාතික වියදම = ද. දේ. වි + ශුද්ධ අපනයනය + විශු. සා. ආ. (ලකුණු 01)

දළ ජාතික නිෂ්පාදනය මත කෙරෙන වියදම = 1150 + (80 - 60) + (40 + 60) (ලකුණු 01)

= 1150 + 20 - 20

= <u>1150</u> (ලකුණු 01)

හෝ

| | | |
|---|---|---|
| දළ ජාතික වියදම = ද. දේ. වි + ශුද්ධ අපනයන + වි. ශු. සා. ආ. | | (ලකුණු 01) |
| = 1190 + 20 + (-20) | | (ලකුණු 01) |
| = <u>1190</u> | | (ලකුණු 01) |

(ii) ශුද්ධ ජාතික වියදම = දළ ජාතික වියදම - ප්‍රාග්ධන ක්ෂය වීම. (ලකුණු 01)

= 1150 - 40 (ලකුණු 01)

= <u>1110</u> (ලකුණු 01)

හෝ

| | | |
|---|---|---|
| ශුද්ධ ජාතික වියදම = දළ ජාතික වියදම - ක්ෂය වීම | | (ලකුණු 01) |
| = 1190 + 40 | | (ලකුණු 01) |
| = <u>1150</u> | | (ලකුණු 01) |

(සූත්‍රය ලිවීම අනිවාර්ය නො වේ)

(ii)







Y = E

Y = C + I වන $Y_E$ ආදායම්

මට්ටම සමතුලිත වේ.

W = J

S = I වන $Y_E$ ආදායම්

මට්ටම සමතුලිත වේ.

**(නිවැරදි එක් රූප සටහනකට ලකුණු 02යි. පැහැදිලි කිරීමට ලකුණු 01)**

(iii) සරල ආර්ථිකයක සමතුලිත නිමවුමට වන බලපෑම, ආයෝජන වෙනස් කළ ප්‍රමාණය ගුණකයේ වටිනාකමෙන් ගුණ කරමින් ගණනය කළ හැක.

(ලකුණු 01)

සරල ආර්ථිකයක ගුණකයේ වටිනාකම ආන්තික පරිභෝජන නැමියාව (MPC) මත තීරණය වේ.

$$K = \frac{1}{(1 - b)}$$

(ලකුණු 01)

උදාහරණ :

MPC = 0.8 වන සරල ආර්ථිකයක ස්වාධීන ආයෝජනය 100 කින් ඉහළ නැංවුවහොත්, සමතුලිත නිමැවුම 500 කින් ඉහළ යයි.

$$K = \frac{1}{(1 - b)}$$

**(උදාහරණයට ලකුණු 01)**

$$K = \frac{1}{(1 - 0.8)} = \frac{1}{(0.2)} = 5$$

$$\Delta Y = K \times 100$$

$$\Delta Y = 5 \times 100$$

$$\Delta Y = 500$$

**05 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




05 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 23.26%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 32%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 03ක් ඇති අතර (i) වන කොටස (අ), (ආ), (ඉ), (ඊ) වශයෙන් අනුකොටස් හතරකින් යුක්තය. මෙම ප්‍රශ්නය තුළ වැඩි ම පහසුතාව (i) (අ) සහ (ii) අනුකොටසට හිමිවන අතර, එහි පහසුතාව 60%කි. අඩු ම පහසුතාව ඇත්තේ (i) (ඉ) කොටසට වන අතර, එහි පහසුතාව 19% කි.

★ (i) කොටස ජාතික ගිණුම් සකස් කිරීම ආශ්‍රිත ව දෙන ලද දත්ත ඇසුරින්, ජාතික ගිණුම් සංකල්ප ගණනය කිරීමේ හැකියාව පරීක්ෂාවට යොමු වූවකි. මෙය අනු කොටස් 4කින් යුක්ත වූ අතර, එක් එක් කොටසෙහි පහසුතාවයේ වෙනස්කම් පැවතුණි.

(අ) අනු කොටසෙහි පහසුතාව 60%කි. මෙම කොටස ප්‍රශ්නයේ පහසුතාව වැඩි ම කොටස වේ. සමාහාර ඉල්ලුමට අදාළ සංරචක මොනවා ද යන්න පිළිබඳ ව සිසුන්ගේ දැනුම තවදුරටත් ප්‍රගුණ කළ යුතු ව ඇත.

(ආ) අනු කොටසෙහි පහසුතාව 43%කි. එය දුෂ්කරතාවයෙන් වැඩි ප්‍රශ්න කොටසක් බවට පත් වී ඇත්තේ, දළ දේශීය වියදමෙහි සංරචක මොනවා ද යන්න නිවැරදි ව හඳුනා ගැනීමට සිසුන් අපොහොසත් වී ඇති බැවිණි. එබැවින් දළ දේශීය වියදමෙහි සංරචක මොනවාද යන්න පිළිබඳව සිසුන් තුළ දැනුවත් භාවය ඇති කළ යුතුය.

(ඉ) මෙම අනු කොටසෙහි පහසුතාව 19%කි. මෙම කොටස ප්‍රශ්නයෙහි පහසුතාව අඩු ම කොටස වේ. මෙම කොටසින් විමසා තිබුණේ දළ ජාතික වියදම පිළිබඳ ව ය. වියදම් ප්‍රවේශය ඔස්සේ ගණනය කරන දළ ජාතික නිෂ්පාදිතයේ වටිනාකම, දළ ජාතික වියදමට සමාන වන බව පිළිබඳව සිසුන් තුළ අඩු අවබෝධයක් පැවතුණි. එබැවින් වියදම් ප්‍රවේශය ඔස්සේ දළ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීම සම්බන්ධව සිසුන් තුළ අවබෝධය වර්ධනය කළ යුතු ය.

(ඊ) අනු කොටසෙහි පහසුතාව 27%කි. එය ද සාපේක්ෂව අපහසුතාවයෙන් වැඩි ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය අපහසුතාවයෙන් වැඩි වීම කෙරෙහි බලපා ඇත්තේ (ඉ) කොටසේ පිළිතුරු වැරදි සහගතව ගණනය කිරීම හා ශුද්ධ ජාතික වියදම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් වීම නිසාය.

★ (ii) කොටසෙහි පහසුතාව 60%කි. මෙහි 40% ක දුෂ්කරතාවක් පවතින්නේ සිසුන් සරල, සංවෘත හා විවෘත වශයෙන් සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය ශ්‍රිත හා රූප සටහන් මගින් වෙන් වෙන්ව දැක්වීමට අපොහොසත් වීමෙනි. එබැවින් මේ පිළිබඳ නිපුණතා වර්ධනය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

★ (iii) කොටසෙහි පහසුතාව 53%කි. ගුණකය ලියා දැක්වීමට සිසුන් තුළ දැනුවත් භාවයක් පැවති නමුත් ගුණකය හා නිමවුම අතර සබඳතාව කල්පිත දත්ත භාවිත කර උදාහරණයකින් පැහැදිලි කිරීමේ හැකියාව අඩු මට්ටමක පැවතුණි. එබැවින් ඒ පිළිබඳ ව සිසුන්ගේ නිපුණතාව වැඩි කළ යුතු ය.

### “ආ” උප කොටස

## 06 ප්‍රශ්නය

(මෙම කොටසෙන් ද අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

6. (i) ගනුදෙනු චේතනාව සඳහා මුදල් ඉල්ලුම සහ ආදායම අතර පවතින සම්බන්ධතාව රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(ii) රටක මුදල් සැපයුම තීරණය කිරීමේ දී ණයපත් (Credit card) සැලකිල්ලට ගැනීමටත්, හරපත් (Debit card) සැලකිල්ලට නොගැනීමටත් හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු මොනවා ද? මෙම අරමුණු ඉටුකර ගන්නේ කෙසේ දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) රටක මුදල් සැපයුම පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් භාවිත කරන ගුණාත්මක ණය පාලන උපකරණ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(6) (i) පුද්ගලයාට ආදායම් ලැබීම සහ වියදම් කිරීම එකිනෙකට නො ගැළපීම නිසා ගනුදෙනු කිරීමේ අරමුණින් මුදල් ශේෂ ළඟ තබා ගැනීම ගනුදෙනු චේතනාව නිසා ඇතිවන මුදල් ඉල්ලුම ලෙස හැඳින්වේ.

(ලකුණු 01යි)

- ගනුදෙනු චේතනාව සඳහා මුදලට ඇති ඉල්ලුම යනු ආදායම් උපයන කාලයත් වියදම් ගෙවන කාලයත් අතර පරතරය තුළ කළ යුතු ගනුදෙනු සඳහා මිනිසුන් ළඟ ගබා ගන්නා මුදල් ශේෂ වේ.

(ලකුණු 02යි)




(ලකුණු 02යි)

(අක්ෂ මාරු කර ඇතත් සම්බන්ධතාව නිවැරදිව දක්වා ඇත්නම් ලකුණු ලබා දිය හැකිය)

(ii) - ණය පත් (credit cards) මඟින් වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට දෙන ණය මුදල්, $M_2$ නිර්වචනයට අනුව ඇතුළත් වේ. ණයපත් ද වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ණය ලබා දීමේ ක්‍රමයකි. ණය පත් හිමිකරුවා ඉන් භාවිත කරන ණය ප්‍රමාණය මුදල් සැපයුමට ඇතුළත් වේ.

(ලකුණු 03යි)

- හරපත් (debit cards) නිකුත් කෙරෙන්නේ දැනටමත් තිබෙන බැංකු තැන්පතු සඳහාය. එම තැන්පතු දැනටමත් $M_2$ යටතේ මුදල් සැපයුමට ඇතුළත් වේ. එමගින් කෙරෙන ගනුදෙනු නැවත ඇතුළත් කිරීම ද්විගණන දෝෂයකට හේතු වේ.

(ලකුණු 02යි)

(iii) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු දෙකකි

1) මිල හා ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීම
2) මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වා ගැනීම

(ලකුණු 02යි)

මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා මහ බැංකුව පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කරයි.

- මිල හා ආර්ථික ස්ථායිතාව පවත්වා ගැනීමට මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිය හසුරුවයි. මේ සඳහා මුදල් පදනම හා මුදල් සැපයුම හැසිරවීමේ උපකරණ ලෙස මහ බැංකු පොළී අනුපාතය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ විවිට වෙළෙඳපොළ කටයුතු භාවිත කරයි.

- මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව ඇති කිරීම යනු අභ්‍යන්තර හා බාහිර කම්පන හමුවේ ශක්තිමත් මූල්‍ය ආයතන පද්ධතියක් පවත්වා ගැනීමටය. ඒ සඳහා,

    - බැංකු පද්ධතියේ ද්‍රවශීලතා කළමණාකරණය
    - මූල්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය
    - විදේශ විනිමය කළමණාකරණය

**(එක් කරුණකට 1යි. දෙකම ලියා තිබේනම් 03)**

(iv) ගුණාත්මක ණය පාලන උපකරණ වනුයේ

- ණයවර ලිපි සඳහා කාසි ආන්තික නියම කිරීම
- ණය ශීර්ෂ පිළිබඳ උපරිම සීමා නියම කිරීම
- ඇප සුරැකුම් වෙනස් කිරීම
- යහ පෙළඹවීම
- වරණාත්මක පොළී අනුපාත නියම කිරීම

**(එක් කරුණකට 1 බැගින් ලකුණු 05)**

**06 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




06 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 55%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 41%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 34%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 19%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 6%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 04 ක් ඇති අතර (i) කොටසෙහි පහසුතාව උපරිම වුව ද එහි පහසුතාව 46% කට සීමා වී ඇත. පහසුතාව අඩු ම කොටස (iv) කොටස වන අතර, එහි පහසුතාව 19% ක් පමණි. iii කොටසේ පහසුතාව 45% ක මට්ටමක පවතී. (ii) කොටසේ පහසුතාව 28% කි.

★ (i) වන කොටසේ දුෂ්කරතාව 54%කි. ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම හා ආදායම අතර සම්බන්ධතාව සිසුන් පැහැදිළි කර තිබුණ ද, එම සම්බන්ධය ප්‍රස්තාරිකව නිරූපණය කිරීමට වැඩි දෙනෙකු අපොහොසත් වී ඇත. සිසුන් හට මෙම ගැටලුව දුෂ්කර වීමට හේතු වී ඇත්තේ ගනුදෙනු චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුම හා ආදායම අතර සම්බන්ධතාව ප්‍රස්තාරිකව දැක්වීම පිළිබඳව ප්‍රාමාණික දැනුමක් නොමැති වීමයි. එබැවින් මුදල් ඉල්ලුම හා එය තීරණය කෙරෙන සාධක අතර සම්බන්ධතාව ප්‍රස්තාරිකව ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුය.

★ (ii) වන කොටසේ පහසුතාව 28%කි. ණය පත් හා හරපත් පිළිබඳව අවබෝධය ව්‍යාකූල නිසා මේවා මුදල් සැපයුමට ඇතුළත් වේද? නො වේද? යන්න සිසුන්ට නිශ්චිතව ප්‍රකාශ කළ නො හැකි වී තිබිණි. ණය පත් හා හරපත් වැනි සංකල්ප මුදල් සැපයුමට සම්බන්ධ වන හෝ නො වන ආකාරය විග්‍රහ කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතුය.

★ (iii) වන කොටසේ පහසුතාව 45%කි. මහ බැංකුවේ අරමුණු නම් කිරීමට සිසුන්ට හැකියාව තිබූ අතර අරමුණ ඉටු කර ගන්නා ආකාරය පිළිබඳ පැහැදිළි අවබෝධයක් නො තිබූ බව පෙනී යයි. මහ බැංකුවේ අරමුණු හා එම අරමුණු ඉටුකර ගන්නා ආකාරය පිළිබඳව සිසුන්ගේ දැනුම සංවර්ධනය කළ යුතුය.

★ (iv) වන කොටසේ දුෂ්කරතාව 81%කි. මහ බැංකුවේ ගුණාත්මක ණය පාලන උපකරණ කවරේ ද? යනුවෙන් අසා ඇති ප්‍රශ්නය ඍජු පිළිතුරු සහිත ප්‍රශ්නයකි. නමුත් මේ සඳහා නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ ඉතා අඩු සිසුන් ප්‍රතිශතයකි. පහසුතාව අඩු වී ඇත්තේ ණය පාලන උපකරණ සම්බන්ධව විෂය කරුණු කෙරෙහි අවධානය යොමු නො වීම නිසා විය හැකිය. එබැවින් මුදල් සැපයුම කෙරෙහි, මූල්‍ය උපකරණ ක්‍රියාකාරීත්වය බලපාන ආකාරය සිසුන්ට අවබෝධ වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සකස් විය යුතුයි.

## 07 ප්‍රශ්නය

7. (i) වෙළෙඳපොළ ආර්ථිකයක රජයේ ප්‍රධාන කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
(ii) ආර්ථික වර්ගීකරණයට අනුව රාජ්‍ය වියදම් වර්ග කර දක්වන්න. (ලකුණු 05 යි)
(iii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය හිඟය පියවා ගැනීමට මෑතකාලයේ දී යොදාගත් ප්‍රධාන මූලාශ්‍ර මොනවා ද? (ලකුණු 05 යි)
(iv) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය අනුපාතිකයේ මෑතකාලීන ප්‍රවණතා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(07) (i) - වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය කාර්යක්ෂම කිරිමට නෛතික රාමුව සකස් කිරීම (ලකුණු 04යි)
- සම්පත් බෙදී යාමේ කාර්යක්‍ෂමතාව ඇති කිරීම
  - පොදු භාණ්ඩ සැපයීම
  - බාහිරතා පාලනය
- පොදු සම්පත් භාවිතය කාර්යක්‍ෂම කිරිම
- ආදායම් බෙදී යාමේ සාධාරණත්වය ඇති කිරීම
- ආර්ථික ස්ථායීතාව ඇති කිරීම
- ආර්ථික වර්ධනය ඇති කිරීම
- සානුබල සැපයීම
- යටිතල පහසුකම් සැපයීම (එක් කරුණකට 01 බැගින් ලකුණු 05)

(ii) - වර්තන වියදම
- ප්‍රාග්ධන වියදම (ලකුණු 03යි)

වර්තන වියදමේ උප ශීර්ෂ :
- භාණ්ඩ හා සේවා මත වියදම
- පොළී ගෙවීම්
- වර්තන පැවරුම් හා සහනාධාර

(ලකුණු 03යි)

ප්‍රාග්ධන වියදමේ උප ශීර්ෂ :
- මූර්ත වත්කම් අත්පත්කර ගැනීම
- ප්‍රාග්ධන පැවරුම්/ සංක්‍රාම
- ඌණ වියදම් සඳහා ප්‍රතිපාදන

(උප ශීර්ෂයකට ලකුණු 01 බැගින් කරුණු 3ට ලකුණු 03යි)

(iii)මෑත කාලයේ දී අයවැය හිඟය පියවීමට යොදාගත් ප්‍රධාන මූලාශ්‍ර වන්නේ

1 **දේශීය මූල්‍යනය -**
   1.1 වෙළෙඳපොළ ණය
   1.1.1 බැංකු අංශය
   1.1.2 බැංකු නො වන අංශය

2 **විදේශීය මූල්‍යනය -**

(එකකට ලකුණු 01 බැගින් ලකුණු 05)

(iv)

| වර්ෂය | දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය | රජයේ ආදායමේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය |
|---|---|---|
| 2010 | 81.9 | 100.4 |
| 2011 | 78.5 | 92.5 |
| 2012 | 79.2 | 96.8 |
| 2013 | 78.3 | 102.2 |

ඉහත දී ඇති විචල්‍යයන්ගේ ආසන්න වර්ෂ දෙකක අගයන් නිවැරදිව දක්වා තිබේ නම් ලකුණු 03 යි. ඉදිරිපත් කර ඇති දත්ත අනුව ණය ප්‍රමාණය අඩු වී තිබේද වැඩි වී තිබේද යන්න දක්වා තිබේ නම් ලකුණු 02 යි.

**07 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




07 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 59.53%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 29%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 30%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් iv ක් ඇති අතර i, ii කොටස් පහසු ම ප්‍රශ්නය වී ඇත. එහි පහසුතාව 67%කි. පහසුතාව අඩු ම කොටස iv වී ඇති අතර, එහි පහසුතාව 18%කි. ii, iii කොටස්වල පහසුතා පිළිවෙළින් 67% සහ 46% වේ.

★ (i) වන කොටසේ පහසුතාව 67%කි. අවම වශයෙන් කරුණු 5ක් බලාපොරොත්තු වුවද, සිසුන් කරුණු 4ක් ලියා තිබූ අවස්ථා පැවතුණි. මෙම කොටසට ලකුණු 5ක් වෙන් කර ඇති බැවින් පිළිතුරු ලිවීමේ දී අදාළ සියලු කරුණු ඇතුළත් කර පිළිතුර සංවිධානය කර ගැනීමට සිසුන් පුහුණු කළ යුතුය.

★ (ii) මෙම කොටසෙහි පහසුතාව ද 67%කි. වර්තන වියදම් ඉතා පැහැදිලිව ඉදිරිපත් කිරීමට සිසුන් සමත් වී ඇත. නමුත් රාජ්‍ය වියදම් තුළ ප්‍රාග්ධන වියදම් නිවැරදිව ඉදිරිපත් නො කිරීම, අඩු ලකුණු ලබා ගැනීමට හේතු විය. රජයේ වර්තන වියදම් සංයුතිය පිළිබඳව මෙන්ම ප්‍රාග්ධන වියදම් සංයුතිය සම්බන්ධව ද සිසුන් දැනුවත් විය යුතුය.

★ (iii) මෑත කාලයේ අයවැය හිඟය පියවීමට යොදා ගත් මූලාශ්‍ර අසා ඇති මෙම ප්‍රශ්නයේ පහසුතාව 46%කි. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුර තුළ "මෑත කාලය" යන්න අවධාරණය වී ඇත. අය වැය හිඟය පියවීමට යොදා ගන්නා මූලාශ්‍ර දැක්වීම වෙනුවට, එකී මූලාශ්‍ර යටතේ යොදා ගත් උපකරණ දැක්වීම නිසා, සිසුන් ලකුණු අහිමි කර ගෙන ඇත. රාජ්‍ය ණය මූලාශ්‍ර හා උපකරණ වෙන් වෙන්ව දැක්වීමට සිසුන් තුළ අවබෝධය වර්ධනය කළ යුතුය.

★ (iv) මෙම කොටසෙහි දුෂ්කරතාව 82%කි. රාජ්‍ය ණය දත්ත පිළිබඳ දැනුම සිසුන්ගේ ප්‍රමාණවත් නොවේ. ශ්‍රී ලංකා ආර්ථිකය සම්බන්ධ රාජ්‍ය ණය දත්ත පිළිබඳ සිසුන් දැනුවත් කිරීම වැදගත් වේ.

## 08 ප්‍රශ්නය

8. ශ්‍රී ලංකාව සහ චීනය යන රටවල් දෙක යන්ත්‍ර සූත්‍ර සහ ඇඟලුම් යන භාණ්ඩ නිෂ්පාදනයේ යෙදේ. දෙන ලද යෙදවුම් භාවිතයෙන් රටවල් දෙක විසින් එක් එක් භාණ්ඩයෙන් නිපදවන ප්‍රමාණ පිළිබඳ කල්පිත තොරතුරු පහත වගුවේ දැක්වේ.

| රට | යන්ත්‍ර සූත්‍ර (ඒකක) | ඇඟලුම් (ඒකක) |
|---|---|---|
| චීනය | 50 | 150 |
| ශ්‍රී ලංකාව | 10 | 50 |

ඉහත වගුවේ දැක්වෙන තොරතුරු භාවිතයෙන් පහත (i) සහ (ii) කොටස්වලට පිළිතුරු සපයන්න.

(i) කුමන රටක් කුමන භාණ්ඩයක් සඳහා විශේෂීකරණය විය යුතු ද? පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(ii) විශේෂීකරණයට පසු ව රටවල් දෙක අතර වෙළෙඳ අනුපාතය කුමක් ද? (ලකුණු 05 යි)

(iii) නිදහස් වෙළෙඳාම සීමා කෙරෙන තීරුබදු සහ තීරුබදු නොවන බාධක මොනවා ද? (ලකුණු 05 යි)

(iv) නිදහස් වෙළෙඳාමට රටවල් බාධා පමුණුවන්නේ ඇයි ද'යි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(08) (i) රටවල් දෙක විසින් නිපදවන භාණ්ඩ දෙක සඳහා ආවස්ථික පිරිවැය පහත සේ ගණනය කළ හැකිය.

| | | චීනය | ශ්‍රී ලංකාව |
|---|---|---|---|
| යන්ත්‍ර ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය | = | $\frac{150}{50} = 3$ | $\frac{50}{10} = 5$ |
| ඇඟළුම් ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය | = | $\frac{50}{150} = 0.33$ | $\frac{10}{50} = 0.2$ |

**(ආවස්ථික පිරිවැය නිවැරදිව ගණනය කිරීමට ලකුණු 02)**

මේ අනුව

- චීනයට අඩු ආවස්ථික පිරිවැයක් පවතින්නේ යන්ත්‍ර නිපදවීම සඳහා වන බැවින් චීනය යන්ත්‍ර නිෂ්පාදනය සඳහා විශේෂීකරණය විය යුතුය.
- ඇඟළුම් නිෂ්පාදනය සඳහා අඩු ආවස්ථික පිරිවැයක් පවතින්නේ ශ්‍රී ලංකාව බැවින් ශ්‍රී ලංකාව ඇඟළුම් නිෂ්පාදනය සඳහා විශේෂීකරණය විය යුතුය.

**(හේතුව නොමැතිව විශේෂීකරණය පමණක් දක්වා ඇත්නම් ලකුණු 02 යි. හේතුව සහිතව දක්වා ඇත්නම් ලකුණු 04)**

(ii) - චීනය යන්ත්‍ර ඒකකයක් අපනයනය කොට ඇඟලුම් ඒකක 3 ත් 5 ත් අතර ප්‍රමාණයක් ආනයනය කළ යුතුය.

- ශ්‍රී ලංකාව ඇඟළුම් ඒකකයක් අපනයනය කොට යන්ත්‍ර 0.2 ත් 0.33 ත් අතර, ප්‍රමාණයක් ආනයනය කළ යුතුය.

**(එක් රටක හුවමාරු අනුපාතිකය දක්වා ඇත්නම් ලකුණු 03 යි. රටවල් දෙකෙහි ම හුවමාරු අනුපාතය දක්වා ඇත්නම් ලකුණු 05)**

(iii) - අපනයන තීරු බදු
- ආනයන තීරු බදු

**(ලකුණු 02)**

**තීරබදු නො වන බාධක**

- සලාක නියම කිරීම
- ආනයන අපනයන බලපත්‍ර
- ස්වේච්ඡාවෙන් අපනයනය සීමා කිරීම
- ප්‍රපතනය
- ආනයන තහනම් කිරීම
- පාරිසරික හා සෞඛ්‍ය ආරක්ෂක ප්‍රමිතීන් නියම කිරීම
- විනිමය පාලනය
- වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
- ප්‍රභවය පිළිබඳ නීති රීති පැනවීම
- කාටල් පිහිටුවීම
- කලාපීය ආර්ථික සහයෝගීතා ගිවිසුම් ඇති කර ගැනීම

**(ලකුණු 03)**

(තීරු බදුවල කොටස් නම් කර ඇත්නම් පමණක් මුළු ලකුණු 02 ලබා දෙන්න. තීරු බදු පමණක් නම් ලකුණු නොමැත)

(iv) - ළදරු කර්මාන්ත ආරක්ෂා කිරීම
- සේවා නියුක්තිය ඉහළ නැංවීම
- ගෙවුම් ශේෂ ගැටලු අවම කර ගැනීම
- ප්‍රපතනය වළක්වා ගැනීම
- වෙළෙඳ අනුපාතය වාසිදායක කර ගැනීම
- ප්‍රතික්‍රියා බාධක පැනවීම
- දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම
- රජයට ආදායම් ලබා ගැනීම
- උපාය මාර්ගික වශයෙන් වැදගත් කර්මාන්ත ආරක්ෂා කර ගැනීම
- ජාතික ආරක්ෂාව පවත්වා ගැනීම
- දේශීය සංස්කෘතිය ආරක්ෂා කිරීම

**(එකකට එක බැගින් ලකුණු 05යි)**

08 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා ෑ




08 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 67%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 27%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 25%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 24%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4 ක් ඇති අතර i කොටස වඩාත් ම පහසු වී ඇත. එහි පහසුතාව 65%කි. පහසුතාව අඩු ම කොටස ii වී ඇති අතර, 40% වේ. iii කොටසෙහි පහසුතාව 50% කි. iv කොටසෙහි පහසුතාව 48% කි.

★ (i) කොටසේ පහසුතාව 65%කි. මෙම කොටසින් පරීක්ෂාකර ඇත්තේ, ආවස්ථික පිරිවැය ගණනය කර එක් එක් රටවල නිෂ්පාදිතයන් විශේෂීකරණය කරන ආකාරයයි. නිවැරදිව ආවස්ථික පිරිවැය ගණනය කර සාපේක්ෂ වාසි තීරණය කරගත් සිසුන් නිවැරදි පිළිතුරු ලියා තිබුණි. සාපේක්ෂ වාසි තීරණය කිරීම සඳහා සංඛ්‍යාත්මක නිදසුන් භාවිත කරමින් ආවස්ථික පිරිවැය ගණනය කර ගැනීමේ කුසලතාව වර්ධනය වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කර ගත යුතුය.

★ (ii) කොටසේ දුෂ්කරතාව 60%කි. i කොටසට අදාළව රටවල් දෙක අතර වෙළෙඳ අනුපාතය ගණනය කිරීම මෙම කොටසින් විමසා තිබුණි. මෙහි වෙළෙඳ අනුපාතය යනු අන්‍යෝන්‍ය වාසිදායක හුවමාරු අනුපාතය බව හඳුනා නො ගැනීම දුෂ්කරතාවට ප්‍රධාන හේතුවයි. එබැවින් සාපේක්ෂ වාසි මත හුවමාරු අනුපාතය තීරණය වන ආකාරය පිළිබඳ සිසු කුසලතා වර්ධනය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය විය යුතුය.

★ (iii) කොටසේ පහසුතාව 50%කි. නිදහස් වෙළෙඳාම සීමා කරන තීරු බදු නො වන බාධක මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. තීරු බදු නොවන සංරෝධක වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබීම, සිසුන් තුල සාධන මට්ටම අඩු වීමට බලපා තිබේ. නිදහස් වෙළෙඳාම සීමා කරන තීරු බදු හා තීරු බදු නො වන බාධක පිළිබඳ දැනුම තහවුරු වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සංවර්ධනය විය යුතුය.

★ (iv) කොටසේ දුෂ්කරතාව 52%කි. නිදහස් වෙළෙඳාමට බාධා පැමිණවීමට හේතු මෙම ප්‍රශ්නයෙන් විමසා තිබූ අතර සිසුන්ගේ සාධන මට්ටම අඩු වීමට හේතු සිසුන්ගේ සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇත්තේ, වෙළඳ සංරෝධකවලට පක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක පිළිබඳව අවබෝධයක් නොමැති බැවිනි. නිදහස් වෙළෙඳාමට බාධා පැමිණවීමට හේතු අවධාරණය වන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය සංවර්ධනය කළ යුතුය.

## 09 ප්‍රශ්නය

9. (i) ආර්ථික වෘද්ධිය යන්න නිර්වචනය කරන්න. එය මනිනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 05 යි)
(ii) රටක ආර්ථික වෘද්ධිය සමඟ ජාතික නිෂ්පාදනයෙහි ඇතිවිය හැකි ව්‍යුහාත්මක වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
(iii) 'ආර්ථික සංවර්ධනය බහුමාන ක්‍රියාවලියකි'. පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
(iv) ශ්‍රී ලංකාවේ දිළිඳුකමේ මෑතකාලීන උපනතීන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(09) (i) මූර්ත දළ දේශීය / ජාතික නිෂ්පාදිතයෙහි අඛණ්ඩව වර්ධනය වීමක් ආර්ථික වෘද්ධිය ලෙස හැඳින්වෙන අතර. එහිදී ආර්ථිකයේ නිෂ්පාදන විභවතාවයෙහි දිගු කාලීන ප්‍රසාරණයක් සිදුවේ.

**(ලකුණු 03යි)**

ආර්ථික වෘද්ධිය මනිනු ලබන ක්‍රම දෙකකි.

1. මූර්ත දළ දේශීය/ ජාතික නිෂ්පාදිතයෙහි වාර්ෂික ප්‍රතිශතක වෙනස් වීම මගින්.
2. ප්‍රති ශීර්ෂ මූර්ත දළ දේශීය / ජාතික නිෂ්පාදිතයෙහි වාර්ෂික ප්‍රතිශතක වෙනස් වීම මගින්.

**(ලකුණු 02යි)**

(ii) ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය තුළදී
- කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශ තුනෙහි ම ප්‍රසාරණයක් ඇති වේ
- කෘෂි අංශයට වඩා වැඩි වේගයකින් කාර්මික හා සේවා අංශ ප්‍රසාරණය වේ.
- සේවා අංශය ආර්ථිකයේ වඩාත් ම වැදගත් අංශය බවට පත්වේ.

(අංශ තුනෙහි ම සාපේක්ෂ වශයෙන් සම්පත් භාවිතය සහ තාක්‍ෂණය උපයෝජනය කිරීම වෙනස් වේ.)

**(එකකට 02 බැගින් ලකුණු 05යි)**

(iii)- ආර්ථික සංවර්ධනය යනු මිනිස් ජීවිතයේ ගුණාත්මක තත්වය ඉහළ යාමක් වන අතර එය පරිණාමන ක්‍රියාවලියකි.
ආර්ථික සංවර්ධනය සඳහා ආර්ථික වෘද්ධිය සමඟ පහත කොන්දේසි ඉටුවිය යුතුය.

- ආර්ථිකයේ නිෂ්පාදන අංශයෙහි ව්‍යුහාත්මක වෙනස්කම් හට ගැනීම.
- නිෂ්පාදන සම්පත්වල ඵලදායකත්වය ඉහළ යාම.
- නිෂ්පාදන ශිල්ප ක්‍රම හා තාක්‍ෂණය උසස් වීම.
- නවීකරණය වීම.
- ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ඉහළ සිට පහළට ගලා ගොස් දුගී බව අඩු වීම, විරැකියාව අඩු වීම, ආදායම් විෂමතාව අඩු වීම, තේරීම් ඉහළ යාම ආර්ථික සංවර්ධනයේ දී සිදු වේ.

මෙහි දී ආර්ථික, සමාජ, දේශපාලන, සංස්කෘතික හා පරිසරික යන සෑම අංශ වල ම දියුණුව ඇති විය යුතුයි. මේ අනුව බලන විට ආර්ථික සංවර්ධනය බහුමාන ක්‍රියාවලියක් බව නිගමනය කළ හැකිය.

**(එකකට 01 බැගින් ලකුණු 05)**

(iv) ශ්‍රී ලංකාවේ දිළිඳුකම මැනීම සඳහා බහුලව භාවිත කෙරෙන්නේ දරිද්‍රතාවෙන් පෙළෙන්නන්ගේ දර්ශකයයි. (Poverty Head Count Index) එහි කාලීන උපනති පහත සේ දැක්විය හැකිය.

| වර්ෂය | දිළින්දන්ගේ ප්‍රතිශතය |
|---|---|
| 95/96 | 28.8 |
| 2002 | 22.7 |
| 2006/7 | 15.2 |
| 2009/10 | 8.9 |
| 2012/13 | 6.5 |

**(දිළිඳුකම අඩු වීම දැක්වීමට ලකුණු 02)**
**(සංඛ්‍යා මගින් තහවුරු කිරීමට ලකුණු 03යි)**

**09 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




09 ප්‍රශ්නයට අයදුම්කරුවන්ගෙන් 27.31%ක් පමණ පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 56%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 28%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 12%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 4%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4 ක් ඇති අතර i හා iii කොටස් සාපේක්ෂව පහසු ප්‍රශ්න වී ඇත. එහෙත් ඒවායේ පහසුතාව ද 41% හා 27%කි. පහසුතාව අඩු ම කොටස ii කොටස වී ඇති අතර, එහි පහසුතාව 17%ක් පමණි. සමස්තයක් ලෙස ගත් විට මෙම ප්‍රශ්නය අයදුම්කරුවන් අඩු සාධන මට්ටමක් පෙන් වූ ප්‍රශ්නයකි.

i හා iii කොටස්ද සාපේක්ෂව අඩු පහසුතාව සහිත කොටස් වේ.

★ (i) කොටසෙහි දුෂ්කරතාව 59%කි. ආර්ථික වෘද්ධිය මනින ආකාරය වෙනුවට එය මනින සූත්‍රය ලියා තිබීම ලකුණු අඩු වීමට හේතු විය. ආර්ථික වෘද්ධිය නිර්වචනය කිරීමේ දී විභව නිමවුම හෝ නිෂ්පාදන ධාරිතාව පදනම් කරගෙන එය නිර්වචනය කළ යුතු බවත්, දළ දේශීය නිෂ්පාදිතයේ හෝ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතාත්මක වර්ධනය ඇසුරින් ආර්ථික වෘද්ධි වේගය ගණනය කළ යුතු බවත් සිසුන් දැනුවත් කළ යුතුය.

★ (ii) කොටසෙහි දුෂ්කරතාව 83%කි. ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන නොමැති වීම ලකුණු ලබා ගැනීම දුෂ්කර වීමට හේතු වී ඇත. ආර්ථික වෘද්ධිය, ආර්ථිකයෙහි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමට සමත් වන බවත් එම ව්‍යුහමය වෙනස්කම් කවරේ ද යන්නත්, ඊට හේතු සාධකයන් මැනවින් හඳුනාගෙන නොතිබීමත් දුෂ්කරතාව කෙරෙහි හේතු වී ඇති බව පෙනේ. මෙම සමස්ත ක්‍රියාවලිය අවධාරණය කෙරෙන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත යුතුය.

★ (iii) කොටසෙහි දුෂ්කරතාව 73%කි. ආර්ථික සංවර්ධනය බහුමාන සංවර්ධන ක්‍රියාවලියක් තුළින් සිදුවන බවත් එය සිදුවන ආකාරය පිළිබඳවත් සිසුන් තුළ ප්‍රමාණවත් දැනුමක් නොමැති විය. සංවර්ධනය අර්ථ දක්වන අතර ම එහි විවිධ මානයන් කවරේ ද යන්නද විග්‍රහ කළ යුතුය.

★ (iv) කොටසෙහි දුෂ්කරතාව 80%කි. දිළිඳුකම දත්ත ඇසුරින් පැහැදිලි කිරීමේ හැකියාව සිසුන් තුළ ප්‍රමාණවත් පරිදි නොවීය. දිළිඳුකමේ උපනතීන් දැක්වීමේ දී ඒවා සංඛ්‍යාත්මකව තහවුරු කිරීම වැදගත් වන බව සිසුන් දැනුවත් කළ යුතුය. උපනතීන් දැක්වීමේ දී කිසියම් පෙර වර්ෂයකට සාපේක්ෂව සලකා බලන වර්ෂයේ තත්වය සැසඳෙන ලෙස දත්ත ඉදිරිපත් කළ යුතු බවට සිසුන් දැනුවත් කළ යුතුයි.

## 10 ප්‍රශ්නය

10. (i) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය තිරණය කළ ප්‍රධාන සාධක මොනවා ද? (ලකුණු 05 යි)
(ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සේවා අංශයේ වැදගත්කම සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
(iii) ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ඉහළ වර්ධනයක් ඇති කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 05 යි)
(iv) මෑතකාලීන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(10) (i)
- ඉදිකිරීම් කර්මාන්ත සීඝ්‍රයෙන් දියුණු වීම
- යටිතල පහසුකම් සංවර්ධනය අඛණ්ඩව පැවතීම
- දේශපාලන ස්ථාවර භාවය හා සාමය
- සංචාරක කර්මාන්තය දියුණු වීම
- හිතකර කාලගුණික තත්වයන් අඛණ්ඩව පැවතීම
- ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්
- නිපුණතා සංවර්ධනය
- තාක්ෂණය දියුණු වීම
- වෙළෙඳපොළ පුළුල් වීම

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 05යි)**

(ii) ශ්‍රී ලංකා ආර්ථිකයේ සේවා අංශයේ වැදගත්කම

| වර්ෂය | ද.දේ.නි % ලෙස සේවා අංශය | සේවා නියුක්තිය % ලෙස |
|---|---|---|
| 2011 | 58 | 42.9 |
| 2012 | 57 | 43.0 |
| 2013 | 56 | 44.1 |

- දළ දේශීය නිෂ්පාදිතයට ඉහළ ම දායකත්වයක් ලබා දීම.
- සේවා නියුක්තියට ඉහළ දායකත්වයක් ලබා දීම.
- ධන බාහිරතා ජනනය කිරීම.
- යටිතල පහසුකම් සැපයීම.
- ස්වභාවික සම්පත් භාවිතය අඩු බැවින් තිරසාර සංවර්ධනයට හිතකර වීම.

**(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් 03)**

(iii)
- බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය හා පිරිවැය අවම කිරීම.
- ශ්‍රම වෙළෙඳපොළ දෘඪතා ඉවත් කිරීම
- ප්‍රාග්ධන සම්පාදන මූලාශ්‍ර සුලභ කිරීම හා ඒවායේ පිරිවැය අවම කිරීම.
- විදේශ ඍජු ආයෝජන දිරි ගැන්වීම.
- තාක්‍ෂණය දියුණු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් ලබා දීම.
- කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා බදු සහන සහ දිරි ගැන්වීම් ලබා දීම.
- ගෝලීය වෙළෙඳපොළට ප්‍රවේශ වීම සඳහා දිරි ගැන්වීම.
- ව්‍යවසායකත්ව දිරිගැන්වීම, පුහුණු කිරීම්.

**(එකකට 01 බැගින් ලකුණු 05)**

(iv) - රන් දොර වැඩ සටහන

- මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය (හම්බන්තොට වරාය)
- මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ
- දක්ෂිණ අධිවේගී මාර්ගය කොළඹ/ කටුනායක අධිවේගී මාර්ගය
- ලක්විජය තාප විදුලි බලාගාරය.(නොරච්චෝලේ)
- ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාරය
- කෙළවරපිටිය තාප බලාගාරය
- උතුරු මහා මාර්ග සංවර්ධන වැඩ සටහන.
- දකුණු කොළඹ වරාය සංවර්ධනය.

- මග නැගුම
- නැණසළ, විදාතා මධ්‍යස්ථානය, මහින්දෝදය විද්‍යාගාර වැඩසටහන

**(එකකට 01 බැගින් ලකුණු 05)**

**10 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




අයදුම්කරුවන්ගෙන් 31.16%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇත (ප්‍රස්තාරය 2). මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වෙයි.
ඉන් ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 54%ක් පමණ ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 36%ක් පමණ ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 9%ක් පමණ ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 1%ක් පමණ ද
ලකුණු ලබාගෙන ඇත.




මෙම ප්‍රශ්නයේ කොටස් 4ක් ඇති අතර ii කොටස වඩාත් ම අපහසු වී ඇත. එහි පහසුතාව 12%කි. පහසුතාව වැඩි ම කොටස iv වේ. එහි පහසුතාව 42%කි. i වන සහ iii වන කොටස් ද අඩු පහසුතාවක් ගෙන ඇති අතර ඒවායේ පහසුතා 24% හා 33% බැගිනි. සමස්තයක් ලෙස ගත්විට අඩු ම පහසුතාව සහිත ප්‍රශ්නයකි.

* (i) කොටසෙහි දුෂ්කරතාව 76%කි. කාලීන වශයෙන් ආර්ථික වෘද්ධිය කෙරෙහි හේතුවන සාධක ප්‍රශ්නයෙන් විමසා ඇති අතර සිසුන් වැඩි ප්‍රතිශතයක අදාළ කාලපරිච්ඡේදයේ ආර්ථික වෘද්ධියට හේතුවන සාධක පිළිබඳ දැනුම යාවත්කාලීනව නො තිබූ හෙයින් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත්ව ඇත. එම නිසා මහ බැංකු වාර්තාව වැනි කාලීන මූලාශ්‍ර ඇසුරෙන් දැනුම සංවර්ධනය කළ යුතුය.

* (ii) කොටසෙහි දුෂ්කරතාව 88%කි. දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය තුළ සේවා අංශයේ වැදගත්කම මේ කොටස මගින් විමසුව ද සිසුන්ට සේවා අංශයේ දායකත්වය පිළිබඳව ප්‍රමාණවත් දැනුමකින් නොතිබුණි. රටක සමස්ත නිෂ්පාදනයට විවිධ අංශ මගින් සිදු කෙරෙන දායකත්වය සංඛ්‍යා දත්ත මගින් අවබෝධ කර දීමට කටයුතු කළ යුතුය.

* (iii) කොටසෙහි දුෂ්කරතාව 62%කි. මෙම කොටස මගින් විමසන්නේ ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ ඉහළ වර්ධනයක් ඇති කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳවය. නමුත් සිසුන් වැඩි දෙනෙකු අදාළ මතෘකාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා නැත. එබැවින් අදාළ ක්ෂේත්‍රයේ දැනුම ලබා ගැනීමට මග පෙන්විය යුතුයි.

* (iv) මෙම කොටසෙහි දුෂ්කරතාව 56%කි. ප්‍රශ්නය මගින් විමසා ඇත්තේ මෑත කාලීනව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ යටිතල පහසුකම් පිළිබඳව ය. සිසුන් වැඩි ප්‍රතිශතයක් නිවැරදි පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත්තේ කාලීනව ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති, ඒවායේ පරමාර්ථ, ප්‍රතිලාභ ලබන්නන් පිළිබඳ අවබෝධයෙන් නො සිටි බැවිණි. මෙම මාතෘකා පිළිබඳ තොරතුරු රැස් කර ගත හැකි මූලාශ්‍ර පිළිබඳව සිසුන් දැනුවත් කළ යුතුය.

**2.2.3** II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

මෙම ඇගයීම් වාර්තාව සැකසීමේදී භාවිත කරන ලද තොරතුරු සංවිධානය කිරීමෙන්, II පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි තෝරා ගැනීමේ ප්‍රතිශතය හා පහසුතාව දැක්වෙන පහත සඳහන් ප්‍රස්තාරය සහ වගුව ගොඩනැගිය හැකිය.




| ප්‍රශ්න අංකය | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රශ්න තේරීම % | 99 | 80 | 45 | 82 | 23 | 55 | 60 | 68 | 27 | 31 |
| ප්‍රශ්නයේ පහසුතාව % | 53 | 55 | 30 | 62 | 45 | 35 | 51 | 51 | 26 | 28 |

මෙම II පත්‍රය "අ" සහ "ආ" වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න "අ" කොටසට ද අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න "ආ" කොටසට ද අයත් ය. අපේක්ෂකයන් විසින් "අ" කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද "ආ" කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද වන සේ ප්‍රශ්න තෝරා ගනිමින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු විය.

"අ" කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරාගැනීමට ලක්ව ඇත්තේ අංක 1 සහ 4 ප්‍රශ්න වන අතර "ආ" කොටසේ ප්‍රශ්න පහ අතුරෙන් වැඩියෙන් ම තෝරා ගැනීමට ලක්ව ඇත්තේ අංක 8 සහ 7 ප්‍රශ්න වේ. ඒවා තෝරාගනු ලැබීමේ ප්‍රතිශත පිළිවෙළින් 99%, 82%, 68% සහ 60% වේ. II පත්‍රයේ ප්‍රශ්න සියල්ල ම සැලකූ විට වැඩි ම තෝරාගනු ලැබීමට පත්ව ඇත්තේ 1 වන ප්‍රශ්නය යි. විකල්ප ප්‍රශ්න අතුරෙන් වැඩි ම තෝරාගනු ලැබීමට ලක්ව ඇති එම ප්‍රශ්නයට අපේක්ෂකයින්ගෙන් ඉතා විශාල ප්‍රතිශතයක් (99%) පිළිතුරු සපයා ඇත. විෂය නිර්දේශයෙහි මෙම ප්‍රශ්නවලට පාදක වූ තේමා සහ විෂය කරුණු, ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාවලිය තුළ වැඩි අවධානයට ලක් වූ සිසුන් අතර වඩාත් ජනප්‍රිය වූ ඒවා ය. එබැවින් එම ප්‍රශ්නවල පහසුතා සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගත යුතුය. ප්‍රශ්න තෝරා ගනු ලැබීමේ ප්‍රතිශතවල අවරෝහණ පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් අංක 1, 4, 2 සහ 8 වේ. එහෙත් පහසුතාවල එම පටිපාටියෙහි මුලින් ම පිහිටන ප්‍රශ්න අනුපිළිවෙළින් 4, 2, 1 සහ 8 වේ. අංක 1 සහ 4 ප්‍රශ්න වැඩියෙන් තෝරා ගනු ලැබ ඇති නමුදු, ඒවාට සපයන ලද පිළිතුරු එතරම් සතුටුදායක නො වන බවත් වැඩියෙන් ලකුණු උපයා ගැනීමට සමත් වී නොමැති බවත් මෙම තොරතුරුවලින් ගම්‍ය වේ. එබැවින් සිසුන්ගේ වැඩි අවධානයට ලක්වන මෙවැනි ප්‍රශ්නවලින් ඉහළ ලකුණු ලබාගැනීම සඳහා ඉගැන්වීම් - ඉගෙනුම් ක්‍රියාවලියේදී සිසුනට මඟ පෙන්වීම වඩාත් සාර්ථක ප්‍රතිඵල ලැබීමට මහෝපකාරී වේ.

වැඩි ම තෝරාගැනීම ඇති අංක 1 ප්‍රශ්නයෙහි වුව ද පහසුතාව 53%කට සීමා වී තිබීම ද ආර්ථික විද්‍යාව විෂයයෙහි ප්‍රගතිය අපේක්ෂා කරන්නන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. ස්ව අභිප්‍රේරණයෙන් යුතුව ප්‍රශ්නයකට පිළිතුරු සපයන්නකුට, සාමාන්‍ය වශයෙන් ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් වැඩි ප්‍රතිශතයක් උපයා ගැනීමට හැකිවන ආකාරයට තම පිළිතුර නිවැරදි විෂය කරුණු ඇසුරෙන් සංවිධානය කර ඉදිරිපත් කිරීමට ද මඟ පෙන්වනු ලැබිය යුතුය.

අඩුවෙන් ම තෝරා ගනු ලැබ ඇත්තේ අංක 5 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව ද 45%ක අවම අගයකට සීමා වී ඇත. ඊට පාදක වී ඇති විෂය කරුණු කෙරෙහි පන්ති කාමර ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය තුළ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නැති බව පෙනේ.

II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සැලකූ විට පහසුතම ප්‍රශ්නයේ පහසුතාව වුවද 53%කට සීමාවීමත් අංක 3, 5, 6, 7, 9 හා 10 හැර අනෙක් ප්‍රශ්න හයෙන් ම පහසුතාව 60%ට වඩා අඩුවීමත් මෙම විෂයය හා සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන්ගේ අවධානයට ලක් විය යුතු කරුණකි. එමෙන් ම II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව ද 47.11%කට සීමා වී ඇත. මෙම තොරතුරු ඇසුරෙන් අවධාරණය කෙරෙන්නේ ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලිය අනාවරණ පරීක්ෂණ කෙරෙහි යොමුවීමේත් ඉලක්ක ගත ප්‍රතිකාර්ය වැඩ සටහන් නොපමාව ක්‍රියාත්මක කරනු ලැබීමේත් වැදගත් අවශ්‍යතාවයි.

## III කොටස

### 3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා ෘ

### 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ෘ

**පොදු උපදෙස්**

- ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය. එකම ප්‍රශ්නය කොටස් දෙකක් ලෙස එකට ලියැවී ඇති විට, කොටස් දෙකට ම පිළිතුරු සැපයීම කෙරේ අවධානය යොමු විය යුතුය.

- I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතුය. තව ද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් උත්තර පත්‍රයේ යෙදිය යුතුය.

- II පත්‍රයේ (අ) හා (ආ) කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

- නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

- අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

- ප්‍රශ්න අංක හා කොටස් අංක නිවැරදිව ලිවිය යුතුය.

- නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

- ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

- පිළිතුරු ලිවීමේදී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

- ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය හා කාලය අතර පවතින සම්බන්ධය අනුව කාලය කළමනාකරණය කරගත යුතුය.

**විශේෂ උපදෙස් :**

* ආර්ථික විද්‍යා විෂයයේ භාවිත වන පාරිභාෂික යෙදුම් භාවිත කළ යුතුය.
  උදා : පරිභෝජනය, ආන්තික පරිභෝජන නැඹියාව

* අවශ්‍ය තැන්හිදී සංඛ්‍යාත්මක වගු, ප්‍රස්තාර, සූත්‍ර හා සමීකරණ මගින් පිළිතුරු පැහැදිලි කළ යුතුය. ප්‍රස්තාර සටහන් ඇඳීමේදී නිවැරදි පරිමාණයකට ඇඳීමටත්, අක්ෂ නිවැරදිව නම් කිරීමටත් ඒවා වෙනස් වීමේ දී ඊතල සළකුණු මගින් දිශාව දැක්වීමට සැලකිලිමත් විය යුතුය.

* ගණනය කිරීම්වලදී එක් එක් පියවර පැහැදිලිව සඳහන් කළ යුතුය. අදාළ අවස්ථාවලදී නිවැරදි ව ඒකක සඳහන් කළ යුතුය.

* අවශ්‍ය තැන්හිදී නිවැරදි සංකේත භාවිත කළ යුතුය.
  උදා : $M_1$, $M_2$

* අදාළ රූප සටහන් අඳින විට රේඛා නිවැරදිව නම් කිරීම හා ප්‍රවාහවල දිශාව නිවැරදිව දැක්වීම කළ යුතුය.

**ප්‍රස්තාර සඳහා පොදු උපදෙස් :**

* දත්තවලට අනුව ප්‍රස්තාර ඇඳීමේදී ප්‍රස්තාර කඩදාසි යොදා ගැනීම ඉතා වැදගත් වේ. ප්‍රස්තාර කඩදාසි භාවිත නො කිරීම නිසා නිවැරදි ව ගණනය කිරීම් කළ නො හැකි වීමෙන් අයදුම්කරුවන්ට ලකුණු අහිමි වන බව උත්තර පත්‍ර පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

* අක්ෂ නිවැරදිව නම් නො කිරීම හා ප්‍රස්තාර නම් නො කිරීම ලකුණු අඩු වීමට හේතුවකි. උදා-: නි. හැ. මායිම් වක්‍රයේ අක්ෂ නම් කරන විට X හා Y ලෙස පමණක් නම් කර ඇත්නම් ලකුණු දිය නො හැක. එය X භාණ්ඩය හා Y භාණ්ඩය ලෙස සටහන් කළ යුතුය.

* ප්‍රස්තාර ඇඳීමේ දී අන්තඃඛණ්ඩ නිවැරදිව නම් නො කිරීම ලකුණු අඩු වීමට හේතුවකි. උදා-: සැපයුම් වක්‍ර ඇඳීමේ දී එය ඍණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය ඒ පරිදි ප්‍රස්තාරයේ දැක්විය යුතුය.

  උදා-:




  සමාහාර වියදම් රේඛාවේ ද, ස්වාධීන වියදම් ප්‍රමාණය ප්‍රස්තාර සටහනේ නිවැරදිව දැක්විය යුතුය.

  උදා-:




* අක්ෂවල සංඛ්‍යා දත්ත සටහන් කිරීමේ දී පරිමාණය අනුව ලකුණු කිරීම ඉතා වැදගත්ය. දුර කෙටි කර නම් කිරීම ආර්ථික විද්‍යා ප්‍රස්තාරවල නිවැරදි නො වේ.

  උදා-:



* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ආදායම් හා සමාහාර වියදම් ලකුණු කරන විට අක්ෂ දෙකෙහිදී ම දත්ත (ඉලක්කම්) සමාන වන පරිදි ලකුණු කර, සම ආදායම් වියදම් රේඛාව ඇඳිය යුතුය. එසේම ස්වායත්ත විචල්‍යය වන ආදායම අනිවාර්යයෙන් ම තිරස් අක්ෂයේ සටහන් කළ යුතුය.

උදා-:




* සාර්ව ආර්ථික සමතුලිතය පෙන්වීමේ දී ගිලිහීම් දැක්වෙන වක්‍රය සෘණ අන්තඃඛණ්ඩයකින් ආරම්භ වේ නම්, එය නිවැරදිව දැක්විය යුතුය.

උදා-:




* නි.හැ. මායිම් වක්‍ර අඳිනු ලබන විට අක්ෂ දෙක ස්පර්ශ වන පරිදි ඇඳීම ඉතාමත් ම වැදගත් වේ එසේ නොමැති විට එය නිෂ්පාදන හැකියා මායිමක් නො වේ.

3.2. **ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :**

* නිර්වචන සහ සංකල්ප පිළිබඳ ව නිවැරදි හා නිශ්චිත දැනුම තිබිය යුතු අතර, සංකල්ප පිළිබඳ ප්‍රායෝගික භාවිත ප්‍රගුණ කළ යුතුය.

* ආර්ථික හා සමාජයීය කරුණුවල කාලීනව හටගන්නා වෙනස්වීම් හා ප්‍රවණතා පිළිබඳ ව සතුටුදායක අවබෝධයක් ලබා ගත යුතුය.

* මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය වැනි ආයතනවලින් නිකුත් කෙරෙන වාර්තා හා ප්‍රකාශන පරිශීලනය කිරීමට හුරුවිය යුතුය. එමඟින් තම දැනුම යාවත්කාලීන කර ගත යුතුය.


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440